**2021සැප්තැම්බර් මස 16 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021සැප්තැම්බර්මස මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්ඳු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |

| | | | |
|---|---|---|---|
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩි.තාරක මුණසිංහ මහතා විසින් 2021.09.16 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, දිර්ඝ කාලයක් මහ නගර සභාව නියෝජනය කරමින් විශාල ජනමෙහෙවරක් කල ගරු නාගරික මන්ත්‍රි පිලිප් ගාවින් මත්තෙස් මැතිතුමාගේ ශෝක යෝජනාව ලබන මාසයට යොමු කිරිමට කටයුතු කරන අතර එතුමා වෙනුවෙන් විනාඩියක නිහඬතාවයක් ආරක්ෂා කරන්න මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2021.08.05 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රි - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2021.08.05 දින සභා රැස්විම් වාර්තාව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රි - බී.සජිත් දූමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 3(18) කාරනාව සම්බන්ධව මම සඳහන් කලේ "කොවිඩ් රෝගය වගේම ඒ හා සම්බන්ධ කාරනා වලදි අපි ගරු නගරාධිපති සමන්ලාල් මැතිතුමා ගන්නා යහපත් තීන්දු වලට අපි සහයෝගය ලබා දෙනවා කියලා" සංශෝධනය වෙන්න ඕන.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වාර්තාවේ 3(4) මා විසින් ප්‍රකාශ කරන ලද "මොරටුවේ ප්‍රධාන සෞඛ්‍ය බලධාරියා ලෙස ඔබ පුන පුනා ප්‍රකාශ කර පරිදි" කියන පරිදි මම ඒ කාරණය ඇතුලත් කරමින් කියලා මම අදහස ප්‍රකාශ කලේ. ඒය ඇතුලත් කරන්න කියා ඉල්ලා සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021.08.05 දින පැවති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

### 2(1) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ගරු මහ නගර සභා මන්ත්‍රී ඒ.එච් සුරේශ් ඉන්දික මහතා අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

### 2(2) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ගරු මහ නගර සභා මන්ත්‍රී එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

### 2(3) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ගරු මහ නගර සභා මන්ත්‍රී එම්.කුමාර රාජරත්න මහතා අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

## 03. <u>සභාව අමතා එවන ලද ආයාචනා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, රටේ පවතින තත්වයත් නිසා අපි ඉතාමත්ම කෙටි කාලයකට සීමාකරගෙන 50% නියෝජනය කරමින් සභාව පවත්වාගෙන යන්න කටයුතු කරමු.

## 03(1) <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ රෝග ව්‍යාප්තිය පාලනය කිරිම වෙනුවෙන් නිරෝධානයට ලක්වෙන පවුල් නිවෙස් වල තබා ගැනිම සඳහා රජය මැදිහත් විමෙන් සෞඛ්‍ය නිර්දේශ මත රු.දසදහසකට ආසන්න බඩු මල්ලක් සෑම නිරෝධානය වන පවුලකටම ලබා දුන්නා. ඒකේ අරමුණ තමයි ආදායම් තත්වය නොසලකා ඔවුන්ගේ ආශ්‍රිතයන් තවදුරටත් වලක්වා ගැනිම. එය ඉතාම හොඳ ක්‍රියාවක්. නමුත් අගෝස්තු 23 වනි දින චක්‍රලේඛයක් මගින් මෙය වෙනස් කරනවා. ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මොරටුව ජනතාවටත් බලපාන නිසා තමයි මේ කාරණය අපි මතු කරන්නේ. දැන් ඒ චක්‍රලේඛණයට අනුව අඩු ආදායම්ලාභි පවුල් වලට පමණක් මේ බඩු මල්ල ලබා දිමට තීරණයක් අරගෙන තිබෙනවා. ඒක ඇතුලේ සිද්ධ වෙලා තියෙන කාරණය තමයි අද වෙනකොට නිරෝධානයට පත් වෙන අය විශාල වශයෙන් අපහසුතාවයකට පත් වෙලා තියෙනවා මේ සහනය නොලැබෙන නිසා.සමහර පවුල් වලට ඒ උදව් උපකාරය ඥතීන්ගෙන්

හිතවතුන්ගෙන් ලැබෙනවා. බොහෝ දෙනෙකුට එහෙම නැහැ. ඒ නිසා මේ ක්‍රියාවලිය ඇතුලේ නැවත නිරෝධායන ක්‍රියාවලියේ ඇත්ත අරමුණ අත්හලමින් රජය ගත්ත මේ තීරණය ඉතාම බරපතල තත්වයකට පත්වෙලා තියෙනවා. මොරටුවටත් ඒක බලපාන නිසා සභාවක් විදියට අපටත් මේකට වගකීමක් තියෙන නිසා විශේෂයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඔබතුමාගේ පාලනය තුල මේ ක්‍රියාවලිය නැවත ආරම්භ කරන්න. නිරෝධානයට ලක්වෙන සියලුම පවුල් සඳහා ඒ සහන මල්ල ලබාදිමට කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒහෙම නුනොත් මේ වෙනකොට තත්වය ගරු නගරාධිපතිතුනි නිරෝධානයට පත්වන සමහර පවුල් විශේෂයෙන් පෞද්ගලික ආයතනවල රැකියා කරන පොසිටිව් වුනා ට පස්සෙ ඒ අදාල ආයතන වලට දැනුවත් කිරිමක් කරන්නේ නැහැ ඒක බලපතල තත්වයක් ඒ වගේම ඒ නිරෝධානය සඳහා අලවන දැන්වීම් කොළය සමහර අය ගලවල පැත්තකින් තියලා තමන්ගේ එදිනෙදා ජීවත්වීමේ කටයුත්තට යන්න සිද්ධ වෙලා තියෙනවා. දැන් මේ වෙනකොට දින 21 ක් නිරෝධානයට ලක් කරනවා ගරු නගරාධිපතිතුමනි.ඒ දින 21 තුල ඒ පවුල් ජීවත්වෙන්නේ කොහොමද මේ තත්වය මත කල්පනා කරලා අපි ඉල්ලීමක් කරනවා නැවත මේ නිරෝධානයට පත් වෙන සියලුම පවුල් සඳහා ඒ සහන මල්ල ලබා දීමට කටයුතු කරන්න කියන ඉල්ලීම අපි රජයෙත් ඔබතුමාගෙනුත් කරනවා.

## 03(2) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, විශේෂ සුභ පැතුමක් එක් කරන්න තියෙනවා ලාංකික ක්‍රීඩිකාවක් සම්බන්ධව. පසුගිය අගෝස්තු මාසයේදි ඉතාලි ජාතික කාන්තා ක්‍රිකට් තරඟය නියෝජනය කරන්න මොරටුවේ ක්‍රීඩිකාවකට හැකිවුනා. ඒවගේම ඒ කණ්ඩායම නියෝජනය කලේ සියලුම ලාංකික ක්‍රීඩිකාවන් විම අපිට සතුටට කරුණක් ඒ අතරට මොරටුවෙන් ඉදිරිපත් වුන ක්‍රීඩිකාව තුන්ඉරියව්වෙන්ම දස්කම් දැක්වූවා. ඒ අයගේ පලවෙනි අන්තර් ජාතික ඔස්ට්‍රියා කණ්ඩායම් සමඟ තිබුනු තරඟයේදි. ඇය ඩිශානි සමරවික්‍රම කටුබැද්ද ප්‍රදේශයේ ජීවත් වෙන්නේ. පලවෙනි තරඟය ජයග්‍රහණය කලා. ඇය වෙනුවෙන් අපි සුභ පැතීමක් කරමු කියලා ඉල්ලා සිටිනවා.

## 03(3) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, MOH සම්බන්ධයෙන් අපි ට ප්‍රශ්ණයක් තියෙනවා.අපිට ජනතාවගේ ප්‍රශ්ණයක් කියන්න කොවිඩ් රෝගියෙකුට අමාරු වුනත් කියන්න කවුරුත් නැති තත්වය පත්වෙලා තියෙනවා. සභාවේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු MOH සැලකිය යුතු මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු පිරිසක් මේ වෙනුවෙන් කැප වෙනවා අපි දන්නවා. හැබැයි වෛද්‍යවරු හැටියට ගරු නගරාධිපතිතුමනි, ගමේ කවුරු හරි පොසිටිව් වුනාව මන්ත්‍රීවරයට කතා කරලා කියනවා. මන්ත්‍රීවරයට කියන්න කවුරුත් නැහැ. මන්ත්‍රීවරු අසරණයි. එන්නත් කිරිම පිලිබඳව මන්ත්‍රීවරු දන්නේ නැහැ.තමන්ගේ වසමේ එන්නත් කරනකොටවත් මන්ත්‍රීවරයා දන්නේ නැහැ.අද රජය කියනවා 20-30 අතර තරුණ/තරුණියන් එන්නත්කරණයට ඒන්නේ නැහැ කියලා. ප්‍රදේශයේ මන්ත්‍රීවරයා දැනුවත් කරලා තිබුනා නම් ඔවුන් ගිහිල්ලා යවනවා එන්නත් කරණයට. එහෙම ප්‍රශ්ණයක් තියෙනවා. අපිට රෝගියෙක් මැරුනම කියන්නේ කාටද, ඔබතුමාට අපි ස්තුතිවන්ත වෙනවා විශේෂයෙන්ම. තව අඩුවක් දකිනවා දෙහිවල ගල්කිස්ස කාඩ්බෝඩ් පෙට්ටි හදාගෙන මහ ලොකුවට කථා කරනවා.තව කොහේහරි මන්ත්‍රීවරු පෙට්ටි හැදුවොත් ඒකත් කථා වෙනවා. කාඩ්බෝඩ් පෙට්ටි හදලා රුපියල් දහදාහක් ගන්නවා. හැබැයි මොරටුව මහ නගර සභාවෙ කොරෝනා මරන නිකං ආදාහනය කරන්නේ. කී දෙනනෙක් මැරුනත් නිකං කෙරෙන්නේ. අපි නගර සභාව විදියට ලබාදෙන මහජන සේවය මාධ්‍ය හරහා යන්නේ නැත්තේ

මොන කරුමයකටද කියලා අපි දන්නෙත් නැහැ. ඇත්තටම සමහර වෙලාවට අපිට දුකත් හිතෙනවා. මොරටුව මහා නගර සභාව කියලා කිව්වම එතන ඒක වැටෙන්නේ සමන්ලාල් ප්‍රනාන්දුට ද වෙන කාට හරිද කියන ඒක සම්බන්ධයෙන් ප්‍රශ්ණයක් නැහැ අපි මහා නගර සභාව නියෝජනය කරන පිරිස් හැටියට අපිත් බලාගෙන ඉන්නවා මහ නගර සභාවෙන් සිදුවෙන සේවාවක් අගයන ඒක හැබැයි ප්‍රශ්ණය තියෙන්නේ අපේ නගර සභාවෙන් කෙරෙන සේවාව ඇගයීමක් කරන්නේ නැහැ. අද මාධ්‍ය නැහැ. අපිත් එක්ක සම්බන්ධවෙලා ඉන්න මාධ්‍ය නිදිද. අපි වියදම් කරලා මෙතනට මාධ්‍ය ගෙන්වනවා. හැබැයි අපි ජනතාව වවෙනුවෙන් කරන ජනතා මෙහෙවර  මොරටුව මහා නගර සභාව කොවිඩ් වලට මැදිහත් වුන වැදිහත් විම කිසිදු මහනගර සභාවක් කිසිදු පලාත් පාලන ආයතනයක් සිදු කලේ නැහැ අපේ නගරාධිපතිතුමා හිරේ යන්න තරමටම මැදිහත් වුනා. නමුත් කොවිඩ් එකෙන් කෙනෙක් මැරුණා කිව්වම ඒ මොහොතේ සිට නගර සභාව බර කරට අරගෙන අවසානය දක්වා වැඩ කරනවා කියන ඒක ප්‍රචාරය නොවීම පක්ෂ/විපක්ෂ අපි හැමෝගෙම අභාග්‍ය කියන එකයි මට කියන්න තියෙන්නේ. හේතුව අපි හැමෝම මොරටුවේ ජනතාව දායකත්ව දක්වනවා මේ වැඩේට. එය මොරටුව ජනතාවට සිදුවුන අසාධාරණයක් විදියට මම දකිනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි ඔබතුමා මැදිහත් වෙලා මේ සම්බන්ධව මාධ්‍යය දැනුවත් කරලා මේය රටට කියන්න. මෙපමණ මුදලක් අපි වැය කරනවා කියලා. ඒවගේම සභාවටත් එන්න ඕන වියදම් වාර්තාව.

ඒවගේම මම කථා කරන්නේ MOH දුරකතනයට සම්බන්ධ නොවන ඒක සම්බන්ධව ප්‍රශ්ණයක් තියෙනවා. හේතුව අපි කථා කරලා පෞද්ගලික මට්ටමෙන් මහජන සෞඛ්‍ය පරික්ෂක ගෙන් වැඩ කර ගන්නවා. නමුත් MOH කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරික්ෂකවරු ඔවුන් ගන්න එක කෝල් එකක්වත් ගන්නේ නැහැ මොරටුව ජනතාව අසරණයි මම වගකීමෙන් කියන්නේ. අපි මේ කියන ඒවා යවන්න උඩට. මේ දුක්ගැනවිල්ලක් කියන්නේ ජනතාවගේ. ජනතාව දන්නේ නැහැ නිරෝධායන සහතිකයක් ගන්නහැටි. ඒක ගන්න බැහැ නගර සභාවෙන්. ඒගොල්ලන්ගේ ක්‍රමවේදයක් නැහැ. ගිහිල්ලා ජනතාව නම ලියලා එනව කියනවා. එක සන්නිවේදනයක් නැහැ. ලැබෙන්න කොහොමද කියලා. තෙලවල රෝගියෙකුට අමාරු වෙලා කියන්න කවුරුත් නැහැ MOH මහත්මියට ගන්නවා ගන්නවා ෆෝන් එක උස්සන්නේ නැහැ. අපි දන්නේ නැහැ මොන කරුමයක්ද කියලා. MOH ලා හිතාගෙන ඉන්නවා නම් සර්වබල දෙවියන් වහන්සේ කියලා MOH හිතාගෙන ඉන්නවා නම් එයාට වැරදිලා.මේක යවන්න මම කිව්වා කියලා. MOH ට මහා ලොකු බලයක් දීලා නැහැ.නිරෝධායන පනතින් බලතල දීලා තියෙන්නේ. මේක රජයේ දූර්වල තාවයක් අපි දකින්නේ. මේ පනතේ බලතල තියෙන්නේ නගරාධිපතිවරයාට. නගරාධිපතිවරයා ඉක්මවලා ගිහිල්ලා MOH ගැන කථා කිරීම තමයි මෙතන වැරැද්ද වෙලා තියෙන්නේ. නැත්නම් මේ කොවිඩ් ප්‍රශ්ණය මීට වඩා ලස්සනට විසඳනවා මේ රජය. මෙතන අදාල වගකිව යුත්තෝ හරියට තේරුම් නොගැනීම නිසා තමයි මේ ප්‍රශ්ණය වෙලා තියෙන්නේ. මොකද ජනතාවගේ හෘද ස්පන්ධනය හඳුනන්නේ ගමේ සිටින මන්ත්‍රීවරයා, නගරාධිපතිවරයා. එතකොට නගරාධිපතිවරයාට තමයි බලතල තියෙන්නේ. නගරාධිපතිවරයාට ඒ බලතල ක්‍රියාත්මක කරන්න රජය දුන්නා නම් මන්ත්‍රීවරයාට පුලුවන් නගරාධිපතිවරයා එක්ක ඒ ප්‍රශ්ණය විසඳගන්න.පක්ෂ/විපක්ෂයක් නැහැ. මෙතන වෙලා තියෙන්නේ MOH ට බලතල දීලා MOH දකින්න වත් නැහැ අපිට ඇහුම්කන් දෙන්නේ නැහැ.මේ සභාවේ මේ නගරයේ සිටින ප්‍රධානියා ඔබතුමා ඒ නිසා අදාල පාර්ශවයන්ව දැනුවත් කරලා මේ ප්‍රශ්ණය කරුණාකරලා අපිට විසඳා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

## 03(4) මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමා, මේ කොවිඩ් වසංගතය ව්‍යාප්ත වන වෙලාවේ නිරෝධානය වන පවුල් වලට අදාල බඩු මල්ල ලබා දෙනවට කිසිම නිර්ණායකයක් බැලුවෙන් නැහැ නගරාධිපතිතුමනි. නමුත් අද වෙනකොට මේ රෝගීන්ට ඒ බඩුමල්ල ලබා නොදෙන ත්ත්වයක් වෙලා තියෙනවා ගරු නගරාධිපතිතුමනි. එය ලබා දෙනවානම් ජනතාවට සහනයක් වෙනවා ඒවගේම මේ කාලය තුල රජය රු.2000/- ක දීමනාවක් ලබා දුන්නා රැකියාවක් අහිමි අයට. මේ මුදල ග්‍රාමසේවා වසමක 200 ක් වගේ කොටසකට තමයි ලබා දුන්නේ නමුත් ඊට වඩා වැඩි ප්‍රමාණයක් නිර්දේශ වෙලා තියෙනවා ඒ අහිංසක පවුල් වලට එය ලබාදෙන ලෙස ඉල්ලීම් කරනවා නගරාධිපතිතුමනි. රජයක් විදියට ජනතාවට වගකියන්න ඕන වෙලාවක ඒවා කප්පාදු කිරිම ගැන අපි විරුද්ධ වෙනවා. ඔබතුමා ප්‍රධානියා විදියට ඒ වගකිය යුතු ආයතන වලට දැනුම්දිලා ඒවා ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා

## 03(5) මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමා, මොරටුව මහ නගර සභාව කියන්නේ ජනයාගේ ප්‍රබලතම ආයතනය.ඊට එහා ගිය ආයතනයක් මොරටුවේ නැහැ.මේ ආයතනයේ සභාව යනු මේ ආයතනය මෙහෙයවන ප්‍රබලම අවිය. මේ සභාව නියෝජනය කරන මහජන නියෝජිතයින් ඒ අවියේ ප්‍රධාන උණ්ඩ. හැබැයි අද ගරු නගරාධිපතිතුමනි මොරටුව මහ නගර සභාව අලියා ගිල්ල දිවුල වෙලා තිබෙන්නේ. ඒ අදෝනාව තමයි මේ මහජන නියෝජිතයෝ කරන්නේ. දුර්භික්ෂයකට මුහුණ දිලා ජනයා. ඒ ජනයාට අඩු වැඩි මට්ටමින් පිහිට වෙන්න පෞද්ගලික මට්ටමෙන් දරන උත්සහ වල තියෙන සීමා මායිම් ප්‍රබල ලෙස ප්‍රතිඵල ගේන්නේ නැති බව අපි හැමෝම දන්නවා. ඒ නිසා අපිට හැම තිස්සේම ඒ මන්ත්‍රීධුරයේ පෞෂවය, ඒ වගේම ජනයාට අවශ්‍ය විමේදි ඒ මැදිහත් වෙන්න තියෙන හැකියාව අපි කාටත් ඕනැ පක්ෂ /භේදයක් නැහැ, මහජන නියෝජිතයා තම කැපවිමෙන් පරිත්‍යාගයෙන් තමන්ගේ ජනයා වෙනුවෙන් කලයුතු යුතුකම් වගකීම් ඉටු කරන්න බැරි තත්වයක අද අපි ඉන්නේ. අපිට විසඳුමක් ඕන ගරු නගරාධිපතිතුමනි. අපි ආරම්භයේ සිටිම මේ තත්වය කිව්වා. අපිට හොරට නිදාගෙන ඉන්න අය කුද්දන්න බැහැ. හැබැයි රටක් විදියට ගත්තම මේ රටේ පාලනය මහ විශාල ජනවරමක්, ඒවගේම 3/2 ජනවරමක් මහා බලයක්.20 සම්මත කරලා මහා බලයක්.අපි MOH වගේ කෙනෙක්ව අභියෝගයට ලක් කරන්න ඕන නැහැ.MOH කවුද අභියෝගයට ලක් කරන්න අපි ඔහුට ගරු කරනවා ඔහු සේවාවක් කරන නිසා. ඔබතුමාට කියනවා ඔබතුමා නගරාධිපතිවරයා පොදුවේ අපි හැමෝම ඉල්ලා සිටිනවා ඒක අවස්ථාවක් අපිට සෞඛ්‍ය අමාත්‍යවරයාට කතා කරන්න. ඒ හරහා මොරටුවේ සෞඛ්‍යට MOH එකේ සිටින මහත්ම/මහත්මින්ට කථා කරන්න. මොරටුව නියෝජනය කරන පොලිසියේ නියෝජනයක්, ප්‍රාදේශිය ලේකම්තුමා, පක්ෂ වල නියෝජිතයෙක් ගන්න අපි මුණ දිලා තියෙන අසීරුව අපිට විසදා ගන්න අවස්ථාවක් දෙන්න. එහෙම නැත්නම් මොකක්ද නගරාධිපතිතුමනි අපේ බලය, සභාවේ බලය.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, මම ප්‍රශ්ණයක් අහනවා නොවෙයි ඔබතුමා කථා කරන්න දෙන්න කියන්නේ කාටද?

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, සභාවක් ලෙස ඔබගේ නායකත්වයනේ මේ අය සාකච්ඡා මේසයකට ගෙන්නලා අපිට කථා කරන්න විවෘතව අවස්ථාවක් දෙන්න.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මැතිතුමා, ඒකට එන්නේ නැහැනේ මම මොකද කරන්නේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, සෞඛ්‍ය අමාත්‍යාංශයට වගකියන කාටද සෞඛ්‍ය අමාත්‍යවරයා කියන දෙය අහන්න බැරි මට තේරෙන්නේ නැහැ. සෞඛ්‍ය ඇමතිවරයා කියන දේ MOH ට අහන්න බැරිනම් මොකටද ඒ සෞඛ්‍ය අමාත්‍යාංශය. මේ නම් වලින් නොවෙයි ඔබතුමා උත්සහ ගන්න ප්‍රමාණය අපි දන්නවා නියෝජිතයෝ ඔබේ යටතේ ඉන්නේ. ඔබතුමා දන්නවා අපටත් ඒ උවමනාව තියෙනවා. හැබැයි ඒ උවමනාවට මැදිහත් වෙන්න බැරි වෙනකොට වේදනාවෙන් අපි ඒ අවස්ථාව ඉල්ලනවා මහජන නියෝජිතයෝ විදියට අපටත් මූලික කලයුතු දේවල් ටිකක් දුරකථනයට ඇහුම්කම් නොදෙන එක, රෝගියෙකුට අමාරු වුනාම දැනුම්දීලා මැදිහත් කරන ඒක අපේ PHI මහත්වරුත් පීඩනයක ඉන්නවා. අපිට මේ පීඩනය නිසාම අපි ගන්නේ නැහැ අවස්ථා. එක අවසථාවක කෝල් එකක් අරගෙන උස්සන්නේ නැත්නම් අපි නැවත ගන්නේ නැහැ. අපි උත්සහ කරමු.මේ හැමෝටම මේ අවස්ථාව ඇති කථා කරන්න. නමුත් ඔවුන් අද නිහඬව ඉන්නවා. එක කථාවක් දෙකක් ඇතිනේ. ඇත්ත ප්‍රශ්ණය මේකනේ. එම නිසා මේ සභාවෙන් හරි නියෝජිතයෝ නම් කරලා අපිව යවන්න කථා කරන්න.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන ඒක නොතේරෙනවා නොවෙයි. ඔබතුමා කියනවානේ උත්තරීතරයි සභාව කියලා. සභාව උත්තරීතර නම් අපි ඒ උත්තරීතර භාවය ආරක්ෂා කරමින් තමයි කථා කරන්න ඕන. මේක යුද්ධයක් වගේ ඒක රටක් මැදිහත් වෙලා සාකච්ජා කරනවා වගේ සාකච්ජා කරන්න දෙයක් මේකේ ඉතුරු වෙලා නැහැ. අපි ඒගොල්ලන්ට දිගින් දිගටම ගෞරවාන්විතව වෙච්ච ආරාධනා කලා. ගරු සෞඛ්‍ය කමිටු සභාපතිතුමා ඩෙංගු කමිටුව පවා තියා ගන්න බැරුව ඩෙංගු කමිටුව පවා නවත්තලා තියෙන්නේ. ඇයි කථා කරන්න කවුරුත් නැහැ. ඒ තරමටම පත්වෙලා තිනේනේ. එතුමියට/එතුමාට වැඩ අධික බව වෙන්න ඇති. වැඩ අධික බවට උත්තර තියෙනවා. ඔහුගේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා හෝ අතිරේක වෛද්‍යවරයෙක් හෝ යෙදවීම තුලින් ප්‍රශ්ණ වලට උත්තර තියෙනවා ඒහෙම නැතුව අපි එතනට යන්න මොකක්ද ඒකෙ තේරුම. සභාවක් විදියට අපි එතනට යන්නේ මොකටද? ඔබතුමා කියන එක මට නොතේරෙනවා නොවෙයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, උත්තරීතර බව කියන්නේ තැන ගැන නොවෙයි. උත්තරීතර බව කියන්නේ ගෞරවයක් සහිතව මහජන නියෝජිතයන් තමන්ගේ වගකිම ඉටු කරන හැකියාවක් තියෙන අවස්ථාව. යන තැන ගැටලුවක් නැහැ. හිතනවානම් ඒතනට ගියාම ඒක අපේ උත්තරීතර බව බිදෙනවා කියලා ඒක අපි පිලිගන්නේ නැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුම, ඔබතුමාට පිලිගන්න බැහැ ඔබතුමා ඔතන ඉන්න නිසා. මට පිලිගන්න වෙනවා මම මෙතන ඉන්න නිසා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා,ඔබතුමාට පුලුවන් වෙන්න ඕන මේ මොරටුවේ තියෙන ඕනෑම තැනකට යන්න. ඒ ඔබේ බලය. ඒක හැල්ලුව නොවෙයි.ඔබේ බලවත් කම කරලා තියෙන්නේ මොරටුවේ ඕනෑම අධිකාරියටකට ඕනෑම වෙලාවක කථා කරලා යන්න. ගෙන්නගන්නත් පුලුවන්. ඒක ප්‍රශ්ණ කර ගන්නේ නැතුව මේ මහජන නියෝජිතයා, මූණ දෙන ඒ හරහා ජනයා මූණ දෙන ගැටලුවට විසඳුමට අවස්ථාවට අවස්ථාවක් අරගෙන දෙන්න ඒපමණයි ඉල්ලන්නේ. උත්සහ කරන්න කොහොම හරි ගන්න පුලුවන්ද කියලා.ඔය ආකාරයෙන් අපි ඉල්ලිමක් කලේ ඔය තත්වය මත අමාරුවෙන් අපි මන්ත්‍රිධුරයේ වැඩ කරන්නේ.

**03(6)** **<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, තවත් දැකපු දෙයක් රාවතාවත්ත පෙට්‍රල් ෂෙඩ් ඒක තුල ටිකක් අනතුරු දායක තත්වයක් දැක්ක නිසා ගිහිල්ලා පරික්ෂා කරලා බලන්න වේලිච්ච කුණු ගොඩක් තියෙනවා ෂෙඩ් ඒක අයිනේ දිගටම. විශාල අනතුරක් වෙන්න තියෙන ඉඩ වැඩියි. ඔවුන්ට නියෝගයක් දිලා හරි ඉක්මනින්ම ඒක ඉවත් කරන්න ක්‍රියාමාර්ගයක් ගන්න කියන ඉල්ලිම කරනවා.

**03(7)** **<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පහුගිය කාලේ ධිවරයන්ගේ කටයුතු යම් ප්‍රමාණයකින් අඩාල වුනා මේ ඒක්ස්ප්‍රස්පර්ල් නෞකාව නිසා. ඒනිසා ඔවුන්ට ගෙවන වන්දි බෙදාදිමේ ක්‍රමවේදයක් යටතේ දෙනවා කියන ඒක සඳහන් කලා රජයේ අදාල පාර්ශවයන්. ඒ නෞකාවෙනුත් බලාපොරොත්තු වුන ප්‍රමාණයක් අපිට ප්‍රතිපූර්ණය කර ගන්න රක්ෂණයෙන් හැකියාවක් වුනේ නැහැ. මොරටුව අගුලාන, කොරළවැල්ල මෝදර දක්වා සිටින අපේ ධිවර ජනතාව ට ලබා දෙනවා කියන ඒ ඌණපූර්ණය කරනවා කියපු ඒ දීමනා පිලිබඳ බලාපොරොත්තුවෙන් ඉන්නවා නමුත් ඒක ඉටු වෙලා නැහැ.ඔබතුමා ඒක දන්නවා ඇති.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමාට බාධා කරනවා නොවෙයි නැව වටේට දැන් ධීවරයෝ ධීවර වෘත්තියේ යෙදෙනවා. මම දැක්ක කැහැ ගහලා කියනවා අපිට අවස්ථාව දෙන්න පිටින් ඇවිල්ලා ඒතන මාළු අල්ලාගෙන යනවලු ඒතන මිනිසුන්ට දෙන්නේ නැහැයි කියලා. දැන් ධීවරයින්ට බාධාවක් වෙලා නැහැ ඔවුන් හොඳට ඒතනත් මාලු බානවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මම කියන්නේ දැන් තියෙන තත්වයත් ඒක්ක නොවෙයි පසුගිය කාලේ ඒ සඳහා යන්න බැරි වුනු ඒකේ ඌණපූර්ණය කිරිම සම්න්ධබයෙන් සාකච්ජා කර යුතු වෙනවා. ඔබතුමාට මම මතක් කරන්නේ ඒ ධීවරයින්ට ඒ කාලේ සිදු වුන යම් අගතියක් වෙනවා නම් ඒ අගතිය වෙනුවෙන් දෙනවා කියපු දිමනාව ඉටු කර ගැනිම පමණයි. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(8)** <u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, අපිට දැන් මේ කොවිඩ් වල යම් රැලි ප්‍රමාණයක් ගිහිල්ලා තියෙනවා. ඒවගේම විකෘත්ති ප්‍රබෙදත් ඒක්ක අනාගතයේ මේක ඇති නොවේ කියන විශ්වාසය අපිට තියාගන්න බැහැ. ඒ නිසා නගර සභාව පැත්තෙනුත් කියන විදියට යම් යම් කාරනා සහන ලබාදෙනවා. ඒක සුවිශේෂයි. ඒකට ස්තුතිවන්ත වෙනවා. මේ කියන විදියට MOH නගර සභාවත් අතර තියෙන ගස්ටන දිගින් දිගටම පැවතුනොත් ඒහෙම නගරාධිපතිතුමා මේකේ බලධාරියා විශේෂයෙන් පනතට අනුව සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරා.ඒ නිසා නිශාන්ත ගරු මන්ත්‍රිතුමා කියපු කාරණය මතු කරන්න බැරි වුනාත් මේ වෙලාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා මාර්ගයෙන් සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල් වරයාට තමයි ඒ බලතල තියෙන්නේ ඒ නිසා ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා සාධාරණ විසඳුමක් ලබාගෙන ඊලඟ රැල්ල මතු වුනොත් අපි කොහොමද මොරටුවේ ජනතාව බේර ගන්න අපිට පරිපාලනමය අතින් තියෙන ගස්ටන අඩුකර ගන්න හොඳම මැදිහත් විම කරන්න පුලුවන් මම හිතන්නේ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට තියෙන බලතල තමයි විතැන් කරලා බෙදා දිලා තියෙන්නේ MOH වරුන්ට ඒ නිසා මේ සම්බන්ධයෙන් තියෙන ගැටලු ඒ වගේම අපි යම් විදියකින් අපි කියපු කොවිඩ් ඉන්පොමේෂන් මධ්‍යස්ථානය යම් මුලික අධියරක් ආරම්භ වෙලා තියෙනවා ඒ ගැන සතුටුයි. නමුත් මේක රාජ්‍ය මැදිහත් විමෙන්, මොරටුව විශ්ව විද්‍යාලය මැදිහත් විමෙන් මේක ඩිජිටල් ෆැට්පෝම් ඒකකට ගේන්න පුලුවන් තත්වයකට තියෙනවද කියලා සලකා බලුවොත් මේ ප්‍රශ්ණ තවදුරටත් නිරාකරණය කර ගන්න පුලුවන් නගරාධිපතිතුමනි.අපි ඊලඟ මැච් ඒකට පිච් ඒක හදාගන්න ඕන නැත්නම් මොරටුව ජනතාව කොවිඩ් වලින් පරදින්න නියමිතයි. ඒ නිසා මේ ගැටලු ටික නිරාකරණය කර ගන්න ඒ අවශ්‍ය තැන් විධිමත්කරනය කරන්න කියන ඉල්ලිම කරනවා.

**03(9)** <u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මේ බඩු මල්ල ගැන. ඒක ඇත්තටම ලොකු අස්වැසිල්ලක්. රජය පැත්තෙන් ගත්ත. මේක අනාගතයේදි ලැබේද නැද්ද කියන ඒකත් මුල්‍යමය තත්වයත් ඒක්ක. ඒනිසා මම ඔබතුමාගෙන් ඉල්ලිමක් කරන්නේ අපිට රු.10000/- බඩු මල්ලක් ලබා දෙන්න බැරි වෙයි.මොරටුව නගර සභාව මැදිහත් වෙලා අපට කරන්න පුලුවන් නම් යම් ප්‍රමාණයක ප්‍රාදේශිය කාර්යාලය ගන්න දත්තත් ඒක්ක යාවත්කාලින කරලා සහනයක් ලබා දෙන්න පුලුවන් නම් ගරු ජනාධිපතිතුමා ඒක්කත් අනිකුත් ආයතන ඒක්කත් සාකච්ජා කරන්න මෙය යාවත්කාලින කරන්න පුලුවන්ද කියලා බලන්න.දුප්පත් අහිංසක ජනතාව මම පාර දිගේ ඒනකොට මගේන් අහනවා අපිට ඒක ලැබෙන්නේ නැද්ද කියලා.

**03(10)** **මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**

ගරු නගරාධිපතිතුමා, කොවිඩ් වලට අමතරව යම් ආපදා තත්වයන් තියෙන ස්ථාන තියෙනවා.ඒ තැන් යම් යම් ස්ථාන වල තියෙනවා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඒවගේම ගස් අතු රිකිලි ආපදා තත්වයන් තියෙනවා. ඩෙංගු තත්වයත් උද්ගත වෙලා තියෙනවා ඒ ගැනත් අවධානය යොමු කරලා මේ වෙනකොට යම් යම් ප්‍රතිපාදන වෙන් කිරීම සිද්ධ වෙන්න පුලුවන් සහ ඒ සඳහා ආධාර ලැබෙනවා ආපදා කළමනාකරණය සඳහා ඒවා ඔබතුමාට මැදිහත් වීමෙන් කර ගන්න පුලුවන් නම් මේ ප්‍රශ්ණ වලට යම්තාක් විසඳුමක් ලබා දෙන්න පුලුවන් වෙයි ඒගැනත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(11)** **නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම සජිත් දුමින්ද ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයත් ඒක්කම යමක් දැනුවත් කරන්න ඕන අපි ආණ්ඩු පක්ෂයක් වශයෙන් ආණ්ඩුවක් වශයෙන් ඒක්ස්ප්‍රස්පර්ල් නෞවිකාවෙන් සිදු වුණහානිය පිළිබඳව මේ කාලේ ධීවර වෘත්තිකයින්ට රැකියාව කර ගන්න 50% කට වත් අමාරු තත්ත්වයක් තියෙනවා වාරකන් කාලයට. නමුත් රජයක් වශයෙන් මැදිහත් වෙලා ඒ වගකීම් සහගත ආකාරයෙන් ඒ මුදල ඒ නැව අයිති සමාගමෙන් අරගෙන අපේ ධීවරයින් හැමෝටම වන්දි මුදලක් ලබා දුන්නා. මහ දැල් අයිතිකරුවන්ට වෙනම මුදලක් ඒවගේම ඒ දැල් අදින හැමෝටම රු.17000-18000 ක් අලුත් ගිණුමක් ආරම්භ කරලා ගිණුමට මුදල් ලබා දුන්නා.මම හිතන්නේ රජයෙන් කරන්න ඕන වගකීම් හරියට කරලා තියෙනවා. මේ වෙනකොට 1400 කට ආසන්න ප්‍රමාණයක් මොරටුවේ ධීවර ජනතාවට ඒ වන්දි මුදල් ලබාදීලා තියෙනවා. තව 200 ක් පමණ කොටසක් ඉන්නවා ලබාදෙන්න. මම මේ පිළිබඳව ඒ අධ්‍යක්ෂක තුමාත් සමඟ පෙරේදාත් කථා කළා. සජිත් මන්ත්‍රීතුමාට ඒ කවුරු හරි කියන්න ඇති ඒ 200 ගණනකට දෙන්න තියෙනවා. කොවිඩ් ඒක්ක රට වහලා තියෙන නිසා නිලධාරීන්ගේ පැමිණීම අඩුවක් තියෙන නිසා මේ ප්‍රශ්ණය ඉවර වුන ගමන් ඉතුරු 200 ගණනටත් ලැබෙනවා කියන ඒක මම ඔබතුමාට සඳහන් කරනවා කරන්න ඕන වගකීම හිතුවටත් වඩා රජය මැදිහත් වෙලා කළා. ඒක ධීවරයින්ට මේ වාරකන් සමයේ ඒක ලොකු අස්වැසිල්ලක් වුණා ඒය සඳහන් කරන්න ඕන. මම හිතන්නේ ඔබතුමා දිස්ත්‍රික් කමිටුව නියෝජනය කරන සාමාජිකයෙක් වශයෙන් ඔබතුමත් මේ පිළිබඳව කථා කලා.

දිස්ත්‍රික් කමිටුව නියෝජනය කරන නියෝජිතයෙක් වශයෙන් නගරාධිපතිතුමනි මම කියනවා අඩු ආදායම්ලාභි ජනතාවට ලබාදෙන බඩු මල්ල නියම පරිදි ග්‍රාම නිලධාරි මහත්වරු මැදිහත් වෙලා ඒක කරන්නේ නැහැ ඔබතුමා මහජන නියෝජිතයෙක් වශයෙන් ඒ අවස්ථාවලදි සඳහන් කරලා කියන්න. ඒය ලැබෙන කොටත් ප්‍රමාදවෙලා තමයි ලැබෙන්නේ සමහර දුප්පත් ජනතාව ඉන්නවා ඒදා වේල කන්න නැති. ඉතාම අමාරුවෙන් ඉන්නේ. ඒක ලැබෙනවා නම් සහනයක් වෙනවා. ඒම නිසා ඒය මීට වඩා සක්‍රීය ලෙස කරන්න කියන ඒක ඔබතුමා සඳහන් කරන්න කියන ඉල්ලීම කරනවා.

**04.** **ප්‍රශ්ණ -** නැත

**05.** **යෝජනා -** නැත.

## 06. 2021අගෝස්තු මස ස්ථාවර කමිටු වාර්තා සලකා බැලීම.

**06(1)** 2021.08.09 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටුවාර්තාවේ තිරණයන් සලකා බැලිම .

(මෙම අවස්ථාවේදි නියෝජ්‍ය නගරාධිපති ඩී.සමන්ත සිල්වා මහතා මුලසුනෙහි අසුන්ගන්නා ලදි.)

**මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, කමිටු වාර්තාවේ අංක 2(4) ඇමුණුම 2 ලිපිය සම්බන්ධයෙන් කිසියම් අදහසක් පලකරන්න තියෙනවා කමිටුව මේ ලිපිය ප්‍රතික්ෂේප කරලා තියෙනවා ඒක හරි. නමුත් ලිපිය කියවා බැලිමේදි ගරු නගරාධිපතිතුමනි ගැටළු ගණනාවක් මතුවෙනවා. මේ ලිපිය ඒකිනෙකට පරස්පරයි. ලිපියේ සඳහන වන පරිදි අදාළ ප්‍රශ්න පත්‍ර සකස් කිරිමට අදාළ පැවරිම කරලා තියෙන්නේ යාන්ත්‍රික ඉංජිනේරුතුමාට. ලිපියේ සඳහන් කරනවා එය එතුමාට අදාළ කාරණයක් නොවෙයි කියලා. ලිපියේ සඳහන් කරන පරිදිම නැවත සඳහන් කරනවා ඒ සඳහා සතියක පමන කාලයක් අවශ්‍ය වෙනවා පොත පත පරිශිලනය කිරිමට අවශ්‍යයි ඒම නිසා ඒක විෂයක් සඳහා රු.15000/- ක් අවශ්‍ය වෙනවා. අපිට බරපතල ප්‍රශ්නයක් වෙනවා මේක ඒතුමා පිළිබඳ ගැටළුවක් නොවෙයි අපට ප්‍රශ්ණය තියෙන්නේ. ඒතුමා වගේ කෙනෙකුට මේ ප්‍රශ්න පත්‍ර සකස් කරන්න බලය සහ නෛතික තත්ත්වය මොකක්ද කියලා. ඒතන ප්‍රධානියෙක් මේ ප්‍රශ්ණ පත්‍ර සකස් කිරිමේදි ඒ පිළිබඳ විනිවිද භාවය, රහස්‍යතාවය පිළිබඳ ගැටළුවක් මතු වෙන්න පුලුවන් ඒ වගේම මේ ලිපියට අදාළම නැති කාරණයක් මතු වෙනවා. ඒතුමාගේ වරලත් ඉංජිනේරු ඩිප්ලෝමාව හැදැරිම සඳහා රු.63700/- ක මුදලක් සභාව මඟින් ගෙවන ලෙස ඉල්ලිමක් කරනවා. ඒක මේ ලිපියට ඇතුළත් කිරිම පිළිබඳව බරපතල ප්‍රශ්නයක්. ඒක ඒතුමාට වෙනම ඉදිරිපත් කරන්න තිබුනා. ඒනිසා අපිට මේ තත්ත්වයන් පිළිබඳව ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි අපිට තියෙන ගැටළුව තමයි මේ නිලධාරින් සහ මේ තත්වයන් මෙලෙස ක්‍රියාත්මක වෙන්නෙම සභාවේ විනය පිළිබඳ ප්‍රශ්නය මේ වගේ නිලධාරින් මෙහෙම හැසිරිම පිළිබඳව ප්‍රශ්නයෙන් අපිට පෙනෙන්නේ ඔබේ පාලනය ඇතුළේ මේ තියෙන අර්බුදයක එක සංධිස්ථානයක් තමයි මේ මෙවැනි තත්ත්වයකට සභාවේ නිලධාරින් පවා පත්වෙන්නේ කොහොමද කියන කාරණය බරපතලයි. මෙය ප්‍රතික්ෂේප කිරිම පිළිබඳව අපි සතුටු වෙනවා. නමුත් මේ වගකිමක් සභාව ලෙස පාලකයන් ලෙස ඔබත් දරන්න ඕන කියන විශ්වාසය අපට තියෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව වඩාත් අවධානය යොමු කරන්න. මේ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක් අපේ වැඩ කරන සේවකයන්ගේ උසස් විම් පිළිබඳව නිරන්තර ගැටලුවක් තියෙනවා. ඒ අවශ්‍ය කාලයේදි ඔවුන්ගේ උසස්විම් නොලැබිමට ඒක්තරා හේතුවක් මේ ක්‍රියාවලිය දිගින් දිගටම ඉටු නොවිම. ඒම නිසා මේ කරුණට කල්ගතවෙලා තියෙනවා ඒමනිසා හැකි ඉක්මනින් මෙයට අදාළ ක්‍රියාමාර්ග තෝරලා ඒ සේවකයන්ට සාධාරණය ඉෂ්ඨ කරන්න කියන ඉල්ලිම මේ අවස්ථාවේ කරනවා.

**මහ නගර සභා මන්ත්‍රී - ඩී.ඒම්.සුජිත් පුෂ්ප කුමාර මහතා**

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, කමිටු සභාපති විදියට මම උත්තර දෙන්නම්. සුදේශ් මන්ත්‍රිතුමා කියපු ගොඩක් දේවල් හරි. ඒතුමා නීතිමය අයිතිය සම්බන්ධයෙන් ප්‍රශ්න කළා නෛතික අයිතියක් තියෙනවද කියලා. ඔහුට නෛයිතික අයිතිකමක් තියෙනවා මම හිතන විදියට ගරු

මන්ත්‍රීතුමා , හේතුව ඔහු පළපුරුදු ඉංජිනේරුවෙක් ඒනිසා ඔහුට පුලුවන් ඒ ප්‍රශ්න පත්‍රය සකස් කරන්න. ඔබතුමා කිව්වා එහි රහස්‍යභාවය පිළිබඳ ප්‍රශ්නයක්. අපේ සම්මුඛ පරීක්ෂණ තියන්නේ කොමසාරිස්තුමා. ඒතුමා බලය පවරනවා අදාළ නිලධාරීන්ට ඒ අය ප්‍රශ්න සකස් කරලා තමයි අහන්නේ. ඒක සම්බන්ධයෙන් ගැටළුවක් නැහැ. ඒනිසා ඒතුමට බලය තියෙනවා ප්‍රශ්න පත්‍ර සකස් කරන්න. හැබැයි ඒතුමට සදාචාරාත්මක අයිතියක් නැහැ ඔය වගේ ලිපියක් කමිටුවට ඉදිරිපත් කරන්න. ඒතුමා බොරදියේ මාළු බැමක් තමයි කරලා තියෙන්නේ. ඒකක් ඒතුමා දන්නවා ලොක්ඩවුන් කාලසීමාවක් යන්නේ අපිට ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයෙන් හෝ නයිටා ආයතනයෙන් අපිට මේ සම්බන්ධයෙන් කටයුතු කිරිමට ප්‍රමාද වෙනවා කියලා ඒතුමා දන්නවා. ඒ දන්න නිසා ඒතුමා ඒතුමාව අගය කිරිමක් කරගෙන තියෙනවා මෙයින්. මොරටුව නගර සභාව ඒතුමාට සපයලා තියෙන සේවාව, සපයලා තියෙන පහසුකම් බැලුවම ඇත්තටම මේ වගේ ලිපියක් ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් ඒතුමාම ලැජ්ජා වෙන්න ඕන මෙහි සේවය කරද්දි ඒක ප්‍රශ්න පත්‍රයක් සකස් කිරිමට රු.15000/- ක් ඉල්ලනවා. ඒතුමා යටතේ සිටින සේවකයන්ගේ අභිවෘද්ධිය සඳහා තමන්ගේ අයිතිවාසිකම ලබා ගැනිම සඳහා කෙරෙන කාර්යක්. මෙය මහා ලොකු ප්‍රශ්න පත්‍රයක් නොවෙයි ඒතුමාට මේකට යන්නේ විනාඩි 5 ක් වගේ කාලයක්.

(මෙම අවස්ථාවේදි ගරු නගරාධිපති ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා මූලසුන අසුන් ගන්නා ලදි.)

ගරු නගරාධිපතිතුමනි කථා කරමින් සිටියේ ආයතන කමිටුවේ පැන නැගුනු ප්‍රශ්ණයක් සම්බන්ධව ගරු සුදේශ් මන්ත්‍රීතුමා අහපු ප්‍රශනයක් සම්බන්ධව සභාපති වශයෙන් මම අවසර පතනවා උත්තර දෙන්න. මේ ලිපිය ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් ගරු නගරාධිපතිතුමනි සදාචාරාත්මක ප්‍රශ්නයක් තියෙනවා. ඒක ඒතුමාගේ අයිතියනෙ ගරු සුදේශ් මන්ත්‍රීතුමා. අපිට තිබෙන ගැටළුව මෙය අපි ඉක්මනින් කර ගන්නට ඕන නිසා තමයි අපේ කෙනෙකුට සුහදශිලි විදියට ඉල්ලිමක් කලේ ඒතුමාගෙන්. ඒමනිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ සේවකයන්ට අසාධාරණයක් සිදු වෙලා තියෙන්නේ. ඔබතුමා මැදිහත් වෙලා මේකට මොකක් හෝ විසඳුමක් කරන්න කියලා. ඒනිසා අපි ගෞරවයෙන් ඉල්ලනවා මේ වගේ අපි මෙය පිලිගන්නේ නැහැ කියලා යවලා තියෙනවා. අපිට ප්‍රශ්නයක් තියෙනවා මේ වගේ ලිපියක් ඉදිරිපත් කිරිමේ හැකියාව නිලධාරියෙකුට තියෙනවද කියලා. මේක ආයතන කමිටුව විසින් ඔහුට පවරපු රාජකාරියක් ඒක බැහැර කරන්න බැහැ නිලධාරියෙකුට.රාජකාරියට මුදල් ඉල්ලන්න බැහැ. ඒකට වෙනම විනය පරික්ෂණයක් කරන්නට ඕන. ද්වේශ සහගතව ඉල්ලන්නේ පුහුණුවට මුදල් නුදුන්න නිසා. ආයතන කමිටු සභාපති විදියට ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ගරු කොමසාරිස් තුමාට උපදෙස් දෙන්න කියන ඉල්ලීම ඔබතුමා මේ සම්බන්ධව කෙසේ දකිද කියන ඒක මම දන්නේ නැහැ. මේකට ආදර්ශයක් දෙන්න ඕන ගරු නගරාධිපතිතුමනි, හෙට දවසේ අපේ ගණකාධිකාරිතුමාට, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක තුමාට, විදුලි අධිකාරිතුමාට වැඩක් පැවරුවොත් ඔවුන් මුදල් ඉල්ලා සිටිවි. ඒසේ වුවහොත් මේ නගර සභාව දුවන්නේ කොහොමද? ඒමනිසා මේකට හේතු සොයන්න කියන ගෞරවනීය ඉල්ලිම කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ස්තුතිවන්ත වෙනවා සුදේශ් ගරු මන්ත්‍රීතුමාටත් ඒවගේම ආයතන කමිටු සභාපතිතුමාටත් ඒ කාරණාව සම්බන්ධව අදහස් දැක්විම පිළිබඳව. ආයතන කමිටුවේදි තමයි

මේ කාරණාව සම්බන්ධව අදහස් මතුවෙන්නේ. මේ ලොකු විභාගයක් නොවෙයි මේ ආයතනයේ අවුරුදු ගණනාවක් සේවය කරන සේවකයන්ගේ වැටුප් වර්ධකය ගෙවා ගන්න, ඔවුන්ගේ සේවා උසස්වීම ලබා දෙන්න ඔවුන් පීඩාවට පත් වෙලා ඉන්නේ ඒය ඉක්මන් කර ගැනීම සඳහා. මේ ලිපිය බැලුවම ගරු නගරාධිපතිතුමනි, ඉතාම අප්‍රසන්න , ගුප්ප්සාජනක හැඟීමක් ඇති වෙන්නේ නිලධාරින් සම්බන්ධව. මෙහි කියවෙන්නේ මට මේ වැඩේ අයිති නැහැ, මේක කරනවානම් මෙච්චරක් ඕන මම පුහුණුවට ඉල්ලුවිට ඒය ප්‍රතික්ෂේප කලා, ඒ හින්දා කරන්නේ නැහැ කියන වගේ අදහසක් අපිට බැලුබැල්මට පේන්නේ මට අදාළ රාජකාරියක් නොවයි කියලත් කියනවා. නිලධාරින් කියනවා නම් මට තිබෙන වැඩ වැඩියි, මට අදාළ නැති රාජකාරියක් මේක අපි සමහර වෙලාවට සංවේදි වෙනවා. අපි දන්නවා මේ නිලධාරියා සම්බන්ධව අවුරුදු ගණනාවක් මහජන නියෝජිතයකු වශයෙන් හිටපු නිසා. අද ඒතුමාට අදාළයි කියන ගරාජයත් ක්‍රියාත්මක නොවන නිසා තමයි වෙනත් නිලධාරියෙකුට දාලා අද ඒය ක්‍රියාත්මක තත්ත්වයට ගේන්න වෙලා තියෙන්නේ. අපි දන්නවා ඒතුමාගේ රාජකාරි වෙලාවේ ඒතුමා රැඳී ඉන්නේ කොහේද කියලා. ඒහෙම තත්ත්වයක් තියෙන වෙලාවක ගරු නගරාධිපතිතුමනි, අපි ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාටත් , කොමසාරිතුමාටත් අපි ඒදා කිව්වා මෙතුමාගේ සෘජු අධික්ෂණය යටතේ අපි මේ සභාවට මිලදී ගත්තු දේවල් ගණනාවක් තියෙනවා අක්‍රීයව. මොටර් සයිකල් දෙකක් තියෙනවා අදටත් ඒකට උත්තරයක් නැහැ. පරික්ෂණයක් නැහැ. හැබැයි පොඩි සේවකයකු අතින් මොකක් හෝ වරදක් වුණාම පැය 24 ක් යන්න කලින් ලියුමක් දිපු සභාවක් මේක ඒම නිසා ගරු නගරාධිපතිතුමනි, ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා මේ සභාවෙන් කරුණාකරලා මොහු සම්බන්ධයෙන් පැරණි දේවල් ගණනාවක් තියෙනවා දිගින් දිගටම මතු කරලා මේ පරික්ෂණ කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු කොමසාරිස්තුමා, සුදේශ් ගරු මන්ත්‍රීතුමා කථා කරන වෙලාවේ මට හදිසියේ දුරකථන ඇමත්මක් ගන්නට ඕන නිසා මම ඒළියට ගියේ. ඒතුමාත් කථා කරන්න ඇත්තේ මේ ආශිතව වෙන්න ඇති කියලා මම විශ්වාස කාරනවා.මම ඒදා ආයතන කමිටුවේ හිටියා. මේ තීන්දුව ගන්න වේලාවේ මම කිව්වා පැහැදිලිවම මේකට අනිවාර්යන්ම පරික්ෂණයක් පවත්වලා තීන්දුවක් ගන්න ඕන. මේ කඩයිම් පසුකිරිම සඳහා ඔවුන්ට ඒ තියෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍රය සෑදිමට ඉංජිනේරු වරයෙක් විදියට මහ නගර සභාවක යාන්තික ඉංජිනේරුවරු ඉන්නවානම් ඉන්නේ කොළඹ, දෙහිවල, මොරටුව විතරයි. ඉංජිනේරුවරයෙකුට මේ ප්‍රශ්න පත්‍රය හදන්න හැකියාව තියෙනවා ඕනවටත් වඩා, පුලුවන් කම තියෙනවා, ඒක පිළිගැනිමට ලක් වෙනවා. ඒහෙම තියෙද්දි තමයි මෙතුමා මේ කාර්ය කිව්වේ. මෙය ඒකක් විතරයි මේ වගේ කාරණා ගොඩක් තියෙනවා. ඒ වෙලාවට කවුරු කවුරුත් දැන් මේක ආණ්ඩු පක්ෂයේ වැඩක් කියලා මේක අතඅරින ඒක තමයි වරද. අතඅරින්නේ නැතුව වැරැද්ද කාගෙද කියලා බලලා ඒ වැරැද්ද වෙනුවෙන් පෙනී සිටිනවා නම් මීට වඩා මම කියනවා කොමසාරිස්තුමා වුනත් උදාහරණයක් ගත්තොත් නිලධාරියා මේක ගෙව්වා සමහර විට ගෙව්වා නම් ඒත් ගෙව්වා. මේ වෙනකොට සභාපතිවරු දෙදෙනෙක් , උපසභාපති වරු දෙදෙනෙක් කොවිඩ් වලින් මිය ගිහිල්ලා. අපිට රක්ෂණයක් නැහැ. එහෙම බැහැ නිලධාරින්ගේ අනුමැතියක් ඒනකම් දෙන්න බැහැ කියලා කියනවා. හැබැයි මේ වාගේ වෙලාවට මෙහෙම ඒකක් ඒවනකොට මේකට ගතයුතු ක්‍රියාමාර්ග ගන්න ඕන. ඕනවටත් වඩා කරන්න පුළුවන්නේ. මේවා කෙරෙන්නේ නැහැ. ඒදත් මම කිව්වා මීට වඩා මේ ප්‍රශ්න තියෙනවා කරුණාකරලා මේ ලියපු ඒක ශිෂ්‍යත්වයකට යන්න කියලා කියපු ඒකකට ඒක නිසා මම මේක කරන්නේ නැහැ කියන තැනට තමයි මේ ඇවිල්ලා තියෙන්නේ. මම ඒදා කිව්වා කොමසාරිස්තුමා

කමිටුවකට කොහොමද මේක දාන්නේ කියලා. මොන ආකාරයෙන්ද කමිටුවකට දාන්නේ. මේක දැමීමත් වරදක් කියලා මම පැහැදිලි කරලත් කිව්වා මේක මීට වඩා කල්පනා කරලා මේ කටයුත්ත කරන්න කියලා. මේක ලොකු වරදක්. ඒක පැත්තකින් ගත්තම අපේ ආයතනයේ සිටින නිලධාරින්ගේ දුර්වල කමක්. ආයතනයේ නිලධාරින්ගේ රාජකාරිය පැහැරහැරිමක්. මේ කඩඉම් විභාග තියලා ඔවුන්ගේ වැටුප් වර්ධක වැඩි නොකිරිමේ වරද මේක ඔබතුමන්ලාගේ අපේ නොවෙයි. මේවා නිසියාකාරව කරන්න ඕන.මම දන්නවා මේ සුරංග මන්ත්‍රීතුමාට වෙලා තියෙන අලකලංචිය ගත්තම දැන් ඉන්න තත්ත්වයයි වැටුප් වර්ධක ලැබුනානම් ඉන්න ඕන තත්ත්වයයි බරපතල ප්‍රශ්නයක් දැන් අවුරුදු 20 ත් පැනලා. ඇයි මේ අහිංසක මිනිස්සු පව්. අනිත් ඒක මේක අපි ගෙවන ඒකක්ද? නැහැ. මේක රජයෙන් ඒවන ඒකක්. ඇයි අපි මේවා ප්‍රමාද කරන්නේ. කරුණාකරලා මේවාට නිශ්චිත වෙන්නාවූ දිනයන් වලදි අදාළ කර ගන්නාවූ ඕනවටත් වඩා පුලුවන් මේක කොළඹ ,දෙහිවල ,කොට්ටෙ, කොහේ හරි ගිහිල්ලා මේගොල්ල්ලන්ගේ කඩඉමට තියෙන්නාවූ ප්‍රශ්න පත්‍රයක් ගෙනල්ලා ඒක ආදේශ කර ගන්න. ඒක වැලඳ ගන්න. දැන් අපි වෙන ඒවා වැලද ගන්නේ. මට දිගින් දිගටම කියනවා කොළඹ සැලසුම් කමිටුවකට ගියාම 3000/- ක් ගෙවනවා. මම මගේ බලයට නවත්වලා තියෙන්නේ. අපි 1000/- තාම දෙන්නේ.

මම කිව්වේ ඒක සමහර විට නිලධාරින් මොකක් හරි කිව්වම ඒකට ඇහුම්කම් දෙන ප්‍රමාණයයි අහිංසක සේවකයෙක් ඇහුම්කම් දෙන ප්‍රමාණයත් අතර මම හිතනවා මීට වඩා කොමසාරිස්තුමා සැලකිය යුතුයි මොකද මේ වෙලාවේ අපි කවුරුත් දන්න දේ තමයි මොරටුව මහ නගර සභාවේ ගෞරවාන්විත වෙච්ච සේවාව කරන්නේම මේ අහිංසක සේවකයෝ කවුරුත් ඒක හිතන්නේ නැහැ. මම මේ තුන් පාරක් මෙතන ඉඳගන්නේ මේ අහිංසක සේවකයෝ නිසා. නැත්නම් මට මෙතන ඉඳගන්න බැහැ. මිනිස්සු පොඩි විශ්වාසයක් හැදිලා තියෙන්නේ සේවකයෝ නිසා වැඩ කරා කියලා. ඒ ඇරෙන්න වෙන ඒකක් අපි ගාව නැහැ. අපි සමහර තැන්වල ෆේල් වෙච්ච හැම අවස්ථාවෙම අපිව පාස් කරලා තියෙන්නේ අහිංසක සේවකයෝ. කරුණාකරලා ඒ සේවකයි න්ගේ කටයුත්තට මේ වගේ කෝලන් කථා ඒනකොට ඒවා සභාවකට උචිතත් නැහැ විසිකරලා දානවා මිසක් මේවා ඇතුළත් කරන්නත් ඒපා කමිටු වලට. හරි කැතයි. මේ වගේ දේවල් දැම්මම අපිට ලැජ්ජාවක්. මේවා හැන්සාඩ් වෙනවා. මේවා කොහේ හරි ගියාම දැක්කම හිතයි මේ වගේ ඒකක් වත් නොදා ඉන්න තරම් වත් දැනුමක් තියෙන නිලධාරි නැද්ද කියලා. ඒ තරමටම අපහසුට පත් වෙයි. මේවා මෙතන තියෙන ඒවා නොවෙයි මේවා යන්න ඕන පලාත් සභාවට. අපිට විතරක් හොරෙන් කරලා මේක ඇතුලේ තියා ගන්න පුලුවන් ඒවා නොවෙයි. කරුණාකරලා කොමසාරිස්තුමා මීට වඩා අනුකම්පාවෙන් මේ සේවකයන් දිහා බලන්න ඕන.

ආයතන කමිටු සභාපතිතුමා කිව්වා වගේ සමහර අය කියනවා දාන්න ගෲප් ඒකට ඉංජිනේරු ගෲප් ඒකට දාන්න මේ මොරටුවේ ඉන්නේ ප්‍රවාහන පහසුකම නැත්නම් සේවාවට ඒන්නේ නැත. අහිංසක සමහර රියදුරුවරු ඉන්නවා පහසුකම දෙන්න ඕන තැනේ ඉදලා රියදුරා ඒනවා අමාරුවෙන් පොලිසියෙන් බේරි බේරි මෙතනට ඇවිල්ලා ආපහු වාහනය අරගෙන ඒතනටම යනවා නිලධාරින්ව ගේන්න. හරි ප්‍රශ්න. බලනකොට මේවා එකින් ඒක ගළපාගෙන කරන්න මොකද ජනතාවට නයාට අඳුකොළ ගානට මහජන නියෝජිතයින්ව. එක හැමෝටම පොදුයි. ඒක වෛරයකින් බලන ඒකක් නොවෙයි. මිනිස්සු පීඩාවට පත්වුනාම අපි දිහා බලන්නේ ඒ විදියට. මේ සේවකයෝ සත්භාවයෙන් ඇවිල්ලා කුණු ටික ඇද්දේ නැත්නම් තවත් කොපමණ ප්‍රශ්න ඇතිවෙනවද මොරටුවේ. ඒ නිසා කරුණාකරලා මේ පිළිබඳව ඔබතුමා හෙටම ක්‍රියාත්මක වෙන්න. අද පුලුවන්නම් සභාව ඉවර වුනාව අදම කරන්න. තව තව අදින්න ඒපා. නියෝජ්‍ය කොමසාරිස්තමා ඔබතුමාත් වගකීම මීට වඩා වැඩි කර ගන්න. මේ කනින් අහලා පිටකරගන්න

පුරුදු කර ගන්න ඒපා. ඇඟට අරගෙන කලේ නැත්නම් ලොකු ප්‍රශ්නයක්. ඔයගොල්ල්ව ආරක්ෂා කරන්නයි සේවකයෝ ආරක්ෂා කරන්නයි අපිට ඡන්දය දුන්න මහජනයා ආරක්ෂා කරන්නයි තුනක් ආරක්ෂා කර කර ආයතන ප්‍රධානියෙකුට ඉන්න බැහැ. දෙකක් අතඇරෙනවා. ඒ ඇරෙන්න ඔයගොල්ලන්ගේ එක අතඇරෙනවා කුණු අදින එක විතරයි දුවන්නේ ඒ අහිංසකයෝ විතරයි. අපේ අය වාහනයකින් ඒනවා කළමනාකරන සහකාරවරු වාහනයකින් ඒනවා - යනවා අපි ඒවාට දීලා තියෙන්නේ අවස්ථාව මේ වගේ දෙයක් කරන්නත් බැරිනම් මොකක්ද තියෙන තත්වය. මේ වගේ කාලෙක හොඳටම මේක කරන්නත් පුළුවන්. මහජනතාවගේ ප්‍රශ්න අඩු කාලයක්. අනේ කරුණාකරලා මේක කරන්න. මේ වෙනුවෙන් පෙනී සිටපු සියලුම දෙනාට ගෞරවාන්විත ස්තුතිය පුද කරන්නට ඕන. කමිටු සභාපතිතුමාත් ලොකු මහන්සියක් වුණා. සෞඛ්‍ය කමිටු සභාපතිතුමත් ඇවිල්ලා කථා කනවා. හිටපු සභාපති ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මැතිතුමා දිගින් දිගටම ඇවිල්ලා කථා කරනවා මේ හැම දෙනාට කථා කරන්නේ වරදක් නොවෙයි. ඔබතුමන්ලා මේක ක්‍රියාත්මක කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන කමිටු වාර්තාවේ අංක 03 කරුණ සම්බන්ධව. මෙතෙක් කථා කරපු ඒවා සම්බන්ධව අපේ අදහස ගරු නගරාධිපතිතුමනි, ඉදිරිපත් කරපු අදහස් වැරදි නැහැ. මම හිතනවා මූලිකම ගැටළුව තියෙන්නේ නගරාධිපතිවරයා ලෙස ඔබට තිබෙන බලය ඔබ කළයුතු දේ නොකළ යුතු දේ ඒවගේම මේ නිලධාරි තන්ත්‍රයට තිබෙන බලය ඔවුන් කළ යුතු දේ නොකළ යුතු දේ මෙන්න මේ සීමාව හරියට හඳුනා ගත්තා නම් අපිට මෙන්න මේක ලිහා ගන්න අමාරු වෙන්නේ නැහැ. මේ සේවකයාගේ ගැටළු සේවකයාගේ පාලනය රාජකාරියට අදාළ කරන ඔහුගේ අයිතින් ලබාදීම වෙනුවෙන් මූලික වගකීම තියෙන්නේ කමිටුවට නොවෙයි කොමසාරිස්තුමාට. ඔහුට බලය තියෙනවා මේ උසස්වීම් වලට අදාළ ක්‍රියා මාර්ග ගන්න ඊට අදාළ විභාග වලට ප්‍රශ්න පත්‍ර හදන්න අදාළ වගකිය යුතු අයට භාරදෙන්න ඒතුමාගේ බලය. ඒක නිසා මම හිතනවා මේක හරියට තෝරා බේරා ගෙන ගියානම් දැන් චෝදනා ගණනාවක් කළා මම ඒකහයි නිලධාරියෙකුට ප්‍රශ්න පත්‍රයක් හදන්න දෙනකොටම හිතන්න ඕන. කොමසාරිස්තුමාගේ බලය අනුව සභාව ඉල්ලනවා අපිට මේ කාල ඇතුළේ මේ අහවල් දින වෙනකොට මේක කරලා දෙන්න. ඔබතුමා තමයි ඊට පස්සේ මේක කරන්න කාටද බාරදෙන්නේ කියලා තීරණය කරලා ආයතන කමිටුවට වගකියන්න ඕන. සභාව විමසනවා ඒක.

මෙන්න සභාවට ඒන්න ඕන ඒකක් කමිටුවේ තිබෙනවා නගරාධිපතිතුමා ඉදිරිපත් කරලා. ඒක හරි.ආයතන කමිටුවට එන්න ඕන ඒකක්. සභාව තීන්දු කරන්න ඕන ඒකක්. අපි රාජ්‍ය සේවකයෝ. හැබැයි රාජ්‍ය සේවකයෝ විදියට නොවෙයි අපිට සලකන්නේ. රාජ්‍ය සේවකයට දෙන බොහෝ දීමනා අපිට නැහැ. වගන්තිය ඇතුළේ කථා කරනවා. ඉතාම හොඳ අරගලයක්. මේ රක්ෂණයට අදාල ජනතා විමුක්ති පෙරමුණ එක ගන්නවද නොගන්නවද කියලා ඒක අපේ ප්‍රතිපත්තියක්. හැබැයි ආයතන නීතිය ස්ථාවර කමිටුවේ කථා කරන්න ඕන ප්‍රශ්නයක් හරියටම ඉදිරිපත් කරලා තියෙනවා. ඒ පිළිබඳව ඔබතුමාට අපේ ස්තුතිය. මේක ඉදිරිපත් කරනකොට මේකේ ගැටළුවක් තියෙනවා ඒකත් මතක් කරමින් ගරු නගරාධිපතිතුමනි, ඔබ කියන එක හරි මම පොඩි කොටසක් කියන්නම් “උක්ත කරුණ සලකා බැලූ කමිටුව කෝවිඩ් මර්දන කටයුතු වල යෙදී සිටින සෞඛ්‍ය වෘත්තිකයන් ඇතුළු අනිකුත් සේවාවන් වෙත රක්ෂණාවරණ සහ විශේෂ දීමනා ලබා දී ඇතත් ඒවැනි කිසිදු නීතිමය රැකවරණයක් පළාත් පාලන ආයතන සභිකයින් වෙත ලබා දී නොමැතිවීම මේ වෙනවිටත් මොරටුව මහ නගර සභාවේ මන්ත්‍රීවරු කොවිඩ් 19

ආසාදිතයින් බවට පත්වී තිබීම හා මහජන නියෝජිතයින් ලෙස සභිකයින් වෘත්තිමය ස්වභාවය හේතුවෙන් ඔවුන් රෝගයට නිරාවරණය විමේ විශාල අවධානමක් දැරීම යන තත්ත්වය සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කර මහ නගර සභා ආඥා පනත 289 හා 188 යන වගන්ති යටතේ සලකා දී ඇති නීතිමය ප්‍රතිපාදන යටතේ සහා අරමුදල් යොදවා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියක් යටතේ මේ සඳහා අරගලයක් කරන මේ සභාව මේක වැදගත් වෙයි ලංකාවෙම පළාත් පාලන ආයතවල නියෝජිතයින්ට ඒ අරගලයක් කරද්දි අපට පැවරෙයි වගකීමක්. මේකේ තියෙනවා දෝෂයක් ඔබ කියනවා සෞඛ්‍ය වෘත්තිකයන් ඇතුළු අනිකුත් සේවකයන් වෙත රක්ෂණාවරන සහ විශේෂ දීමනා ලබා දි ඇතත්. ගිනිනිවන සේවකයන්ට, විදුලි සේවකයන්ට රක්ෂණය දීලද?

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ සියලුම අයට අග්‍රහාර රක්ෂණය සම්පුර්ණවම රාජ්‍ය සේවකයන් බැදිලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ සේවකයන්ට අදාළ වගකීම අපි ලබා දිලා නම් මේක සදාචාර සම්පන්නයි. අරගලයක් කළ යුතුයි අපිත් රාජ්‍ය සේවකයන් නිසා මෙවැනි තත්ත්වයක් ඇතුලේ ලැබෙන දේ ලබා ගැනිම සඳහා. ඒක ආයතන කමිටුවේ වගේම මේ සභාවේ වගකීම.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමන්ලා, බොහෝම ස්තුතියි. ඒවගේම තව එක දෙයක් කිව යුතුයි. අපේ යාන්ත්‍රික ඉංජිනේරුතුමා කාලයක් වැඩබැලුවා දෙහිවල මොරටුව මහා නගර සභාවේ නිත්‍ය තනතුර තියෙන වකවානුවේ තමයි ලියුම ඒන්නේ එතුමා මෙහෙන් ඉවත් වෙන්න ලියුමකුත් ඒව්වා දෙහිවලට යන්න දෙන්න කියන වකවානුවේ තමයි මේක එන්නේ. මම කිව්වා මොන විදයකින් වත් තනතුර පුරප්පාඩු කර ගන්න මට බැහැ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් ආවොත් දෙන්නම් කියලා. ඒ වකවානුවෙම දෙහිවලට කෙනෙක්ව එවනවා ඒයා නැවත මෙහෙ නවතිනවා මෙන්න මේ කාල වකවානුවේදි මේ වගේ දෙපැත්තට දෝලනය වන ලියුම් ලිය-ලිය එතුමා දෙහිවල වැඩබලන කාලේ තමයි ලියුම ඒව්වේ.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම සේවකයන්ට ඒ ආවරණය තියෙනවා. නමුත් අපි අවස්ථා ගණනක නාගරික මන්ත්‍රීවරුන්ගේ රක්ෂණය පිළිබදව පක්ෂ/විපක්ෂ සියලුම දෙනා කථා කළා නමුත් එය සිදු වුනේ නැහැ. ඒ සඳහා අනුමැතියක් ලැබෙන්නේ නැති කම තමයි අපිට සඳහන් වෙනනේ. මම ඉල්ලීමක් කරනවා ගරු නගරාධිපතිතුමා අපි අපේ මන්ත්‍රීවරුන්ගේ දීමනාවෙන් හරි අඩු කරලා මොකද අපිට යම් අනතුරක්, රෝගයක් සිදුවුනාම අපි දන්නවා කිසිම රැකවරණයක් නැහැ. මේ මන්ත්‍රීවරු බොහෝමයක් තමන්ගේ ව්‍යාපාරයක් කරගෙන ජීවත්වන අය. ඒ නිසා මොකක් හරි ක්‍රමවේදයක් හදමු දීමනාවෙන් හෝ සභාවෙන් කීයක් හරි දාලා මන්ත්‍රීවරුන්ගේ රක්ෂණය හදන්න. ඒ සඳහා ඔබතුමා මැදිහත් වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේක කරන්න අපෙනුත් යමක් කැපෙනවා. සභාවෙනුත් කැපෙන්න තමයි මේක කරන්නේ. දැන් මේ සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගත්තාම පුලුවන් වෙයි.

2021.08.09 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණ එකතිකව සභා සම්මත විය.

**06(2) 2021.08.10 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

**2021.08.10 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් එකමතිකව සභා සම්මත විය.**

**06(3) 2021.08.10 දින පැවති මහජන උපයෝගිතාව හා ප්‍රජා සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

**2021.08.10 දින පැවති මහජන උපයෝගිතාව හා ප්‍රජා සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.**

**06(4) 2021.08.11 දින පැවති පරිසර සෞඛ්‍ය හා සනිපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

**<u>මහ නගර සභා මන්ත්‍රි - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අංක 03 කරුණට අදාළව 04 වෙනි ඇමුණුම ඔබතුමාලා ඉදිරිපත් කරලා තිනෙවා ජනවාරි සිට ජුලි දක්වා ඝන අපද්‍රව්‍ය විශේෂ ව්‍යාපෘතියේ ආදායම් වාර්තාව මිලියන 2 කට ආසන්න ආදායමක් උපයලා තියෙනවා. ඉතාම හොඳයි. අපි කැමතියි මේ ඝනඅපද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා මෙතෙක් දරන ලද වියදම් පිළිබද සවිස්තර වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ අනුව අපි තව දුරටත් අධ්‍යනය කරලා වඩාත් විධිමත් ලෙස සාර්ථක කර ගැනීම සඳහා අපේ පැත්තෙන් දෙන යෝජනාත් අපිට ඉදිරිපත් කරන්න පුලුවන් වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රි - ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අදහස් කීපයක් තියෙනවා ඉදිරිපත් කරන්න. මොරටුව විවිධ සේවා සමිතියේ දේපලක් වන මෝල්පේ දිනපොල පවත්වාගෙන යන මෙම දේපලේ සතියට දින කීපයක් පමණ යන කෙනෙක් විදියට ඒ ස්ථානයට පැමිණෙන අය සමඟ කථා බහ කරන කෙනෙක් විදියට අපි නිතරම දකින දෙයක් ගරු නගරාධිපතිතුමනි, දෛනිකව වෙළදාම් කිරිමෙන් පසුව පලතුරු / ඒළවළු/ මාළු /කරවල මේවා අද වෙනකොට විශාල කුණු කන්දක් බවට මේ දිනපොල තුළ පවත්වාගෙන යනවා. ගරු නගරාධිපතිතුමනි මේකට වගකියන්න ඕන මොන ආයතනයද මුදල් ගෙවන්න ඕන මොන ආයතනයද කියන ඒක නොවෙයි ගැටළුව. මේ වෙනකොට ජනතාව අපි එතනට ගියාම අපිට ඒල්ල කරන ප්‍රශ්නය තමයි ඒ අය හිතාගෙන ඉන්නවා පළාත් පාලන ආයතනය හැටියට අපි තමයි මේවා අවසාන බැහැර කිරිම කරන්න ඕන කියලා. ගරු නගරාධිපතිතුමනි, දැන් මේ දිනවල තිබෙන ලොකුම ගැටලුව තමයි වර්ෂාව

හේතුවෙන් මේ කුණු ගොඩ තවත් ගොඩවල් කීපයක් බවට පත්වෙලා තියෙනවා. අද ජනතාවට තම අවශ්‍යතාවයන් ලබා ගන්න එතනට යන්න බැරි තත්ත්වයක් උදාවෙලා තියෙනවා. මේ ව්‍යසන කාරි තත්වයත් සමඟ ජනතාවට ඉතා ඉක්මනින් ගිහිල්ලා අවශ්‍යතා ලබා ගන්න පුළුවන් ස්ථානය මෙතන. ඒ ජනතාව අපිට කියනවා ගරු නගරාධිපතිතුමා මෙතනින් යනවා, තවත් මන්ත්‍රිවරු මෙතනින් යනවා නමුත් මේකට තවම උත්තරයක් නැහැ කියලා එම නිසා ගරු නගරාධිපතිතුමනි පොලේ වෙළදාම් කරන අය දන්නවා, විවිධ සේවා සමුපකාරය දන්නවා මේක නගර සභාවේ වරදක් නොවෙයි කියන ඒක. නමුත්, මෙතනට බඩු ගන්න ඒන පාරිභෝගිකයා දන්නේ නැහැ ඒක. පළාත් පාලන ආයතනය හැටියට අපි තමයි මේක බැහැර කරන්න ඕන කියලා. ඒගොල්ලෝ සම්පූර්ණ ප්‍රශ්නය යොමු කරන්නේ අපිට. ඔබතුමා මීට පෙරත් මේ වගේ ප්‍රශ්න මතුවුනාම අපේ ඉල්ලීම පරිදි මැදිහත් වෙලා ඒය ශුද්ධ පවිත්‍ර කරන්න කටයුතු කළා. ඒම නිසා ගරු නගරාධිපතිතුමනි, ඉතා ඉකිමනින් ඔබතුමාගේ මැදිහත් විම වෙලා විවිධ සේවා සමුපකාරයට කථා කරලා කැලි කසළ ඉවත් කිරිමේ කටයුත්ත, දිනපොලට දෛනිකව පැමිනෙන ජනතාව වෙනුවෙන් ඔබතුමා ඒවගකීම යුතුකම ඉටුකරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පසුගිය සභාවේදි මේ සම්බන්ධව ප්‍රශ්න කළා ඒ අවස්ථාවේ ඔබතුමා අදාළ පියවර ගන්වා කියලා ප්‍රකාශ කලා. මා පසුගිය දින යන විටත් ඒම කුණු ගොඩ තිබුනා එ සම්බන්ධවත් පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, දැන් තිලකසිරි මන්ත්‍රීතුමා කථා කරපු කුණු ගොඩුත් ඔබතුමා කථා කරන කුණු ගොඩත් ඒකම කුණු ගොඩනේ. මේක යම් යම් මැතිවරණ කාලසීමා වන්වලදි යම් යම් අපේක්ෂකයින්ව ගෙනල්ලා මේ කුණු ගොඩ නිසා සමන්ලාල්ව දෝෂාරෝපණයට ලක් කරලා තියෙනවා. ඔය වෙළදාම් කරන අයත් ගිහිල්ලා සමන්ලාල්ගේ අයිතියි තමයි කියලා කියපු අවස්ථාත් තියෙනවා. නමුත්, කොහොම වුණත් දැන් මට කරන්න තියෙන්නේ කුමන හෝ තත්ත්වයක් මත එළවළු ටිකක් ගන්න ජනතාවට ඒන්න තියෙන තැන නිසා පොළ වහන්න බැරි නිසා ඉන්නවා ඇරෙන්න මේ පොළ සීල් කරන ඒක විතරයි මට කරන්න තිබෙන ඒකම දේ. ඒකම දේ දැන් මේ පොළ සම්පූර්ණවම අපේ පාරේ අඩි 6 ක් විතර අල්ලාගෙන ඔය පොළ නිසා හිස් කබල ගැලවිලා අම්මා කෙනෙක් මිය ගියා. දැන් ඒ තත්ත්වයට පත් වෙලා එන්න එන්නම පාරවල් පටු කරගෙන වෙළදුන්ට කොපමණ කිවුවත් අහන්නෙත් නැහැ. වෙලදුන් රු .100/- ක් දිලා සමුපකාරයට මාරුවුන වෙළෙන්දෝ ඉන්නවා ඕන තරම්. සමුපකාරය මේක විසදාගෙන සමුපකාරයට අය කරගන්න පුලුවන් ප්‍රමාණයට අයකරනගෙන දැන් අපි වරිපන්ම් බදු අයකරනව, ව්‍යාපාරික බදු අය කරනවා, කසළ බදු අය කරනවා අපි මේ සියලුම බදු අයකරගෙන ජනතාව කුණු අදිනකොට විශේෂයෙන්ම මම සභාවට තිබෙන ලෙන්ගතු කම වැඩි නිසාම. ඒම නිසා මම හිතනනවා ඔබතුමා අවසාන නිවේදනය දෙන්න සමුපකාරයට. නැත්නම් මේ දිනෙන් පස්සේ මේක සීල් කරනවා. සීල් කරන එක ඔබතුමා නිකම්ම කරන්න යන්න එපා මෙම පොළ සහ ආදායම පවත්වාගෙන යන්නේ සමුපකාර සමිතියෙන්. කුණු ඇදීමේ කටයුත්ත කරගෙන යන්න ඕන සමුපකාර සමිතියෙන්, නගර සභාව සමඟ ඒකතු වෙලා. මෙම දිනය පවා දිලා තියෙන්නේ මෙම දිනෙන් පසුව සීල් කරනවා කියලා බෝඩ් ඒකක් ගහලා වැඩේ කරන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒය අනිවාර්යයෙන්ම ඒ විදියට කරන්න. රැස්වීම් තියලත් කරන්නේ නැත්නම් ඒක කරන්න. නිශාන්ත මන්ත්‍රීතුමා කියපු ෂෙඩ් ඒකේ කුණු ගොඩ එකත් ඒ ආකාරයෙන්මයි. කරුණාකරලා ඒකත් කරන්න කියන්න. කුණු ගොඩ දැක්කම නගරය ඉතාම අශෝබන විදියට පෙන්නේ. ඒවගේම විනාශකාරි තත්ත්වයක් ඒන්නත් පුලුවන් ඒකත් එක්කම කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, අපේ සුසානභූමි භාරකරුවන් තිලකසිරි මන්ත්‍රීතුමත් සාක්ෂි කරනවා දෙහිවල නගර සභාවට යන නිසා. සුසාන භූමියක ප්‍රධාන සුසානභූමි භාරකරුව මාරු කරන්නේ නැහැ ලේසියෙන්. ඔහුගේ විනය හේතුවක් නිසා හෝ මිසක් එසේ කරන්නේ නැහැ.දෙහිවල මමත් පරිපාලක වරයෙක් වශයෙන් කටයුතු කරන අතර වෙනත් තැනක සිටින විදේශ් කියලා මහත්මයෙක් තවමත් ඉන්නවා දැන් අවුරුදු 25 කට වැඩියි. සුරංග මන්ත්‍රීතුමත් දන්නවා. දැන් අපිට ආරංචි ඒනවා සුසාන භූමි භාරකරුවන් මාස 6 න් 6 ට ස්ථානමාරු කරනවා කියනවා. ගරු නගරාධිපතිතුමා කරුණාකරලා ඒක කරන්න ඒපා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,අපිව මාරු කරනවා අවුරුදු 4 න් 4 ට. මේ සේවාව සිදු කර ගැනීමනේ කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒක කරන්න එපා. අපිට යන්න අශෝබනයි. තිලකසිරි මන්ත්‍රීතුමයි මමයි අපි දන්නවා. ඔබතුමාට කියන්න යන්න දෙන්නේ නැහැ. හරි කෙනෙක්ව දාලා නිල ඇඳුමක් දිලා ඒ දේ කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පරිසර කමිටුවට අදාළව ගැටළුවක් තියෙනවා අපේ ටැක්ටර් වලින් කුණු ගෙනියන්න ආවාම විදුරු කටු අරගෙන යනකොට බෝතල් කැඩුණු විදුරු විතරයි අරගෙන යන්නේ. ගෙවල් වල තව තියෙනවා ගරු නගරාධිපතිතුමනි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඒ සඳහා වැඩ සටහනක් කරමින් පවතිනවා. දැනට මෙහෙමවත් කරන්නේ මේ අහිංසක සේවකයෝ අපිට තාම ඒ සම්බන්ධයෙන් ඒවා කුඩු කිරිමට කටර් එක ගෙන්න විදියක් නැතුව ඉන්නේ කොවිඩ් නිසා. ගෙනාපුවාම මේ සංවර්ධන කටයුතු වලට ඒ බි සි ඒක්ක විදුරු කටු දාලා පිහන් ගඩොල් දාලා, සෙරමික් කටු,ටයිල් කෑලි දාලා කරන්න වැඩ සටහනක් සකස් කරලා තියෙන්නේ. නැත්නම් කරන්න බැහැ මෙහේ ගෙනල්ල ගොඩ ගහන්න බැහැ ඒවාට ඉල්ලුමක් නැති නිසා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි හොඳයි, මම යෝජනා කරන්න හැදුවේ ඒ සඳහා කුමන හෝ වැඩ පිළිවෙලක් හදන්න කියන ඒක තමයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අංක 4 කාරණාව පිළිබඳව මේ කරුණට අපි ඒකඟයි. නමුත්, මේකේ අනිත් පැත්තට ගමන් කරන්න පුලුවන්. මේ වෙනකොටත් අපි සතුව මේ සඳහා මැදිහත් කරන්න පුලුවන් සේවක සංඛ්‍යාව සහ අපේ හැකියාව අනුව ඒ කියන්නේ නිරෝධායනය අවසන් වුනු නිවෙස් වලට විෂබීජ හරණය කල යුතුයි. දැනට කරගෙන යනවා. ඒ ප්‍රමාද වීම් තත්ත්වයත් ඒක්ක මේ ආයතනවල විෂබීජ හරණය කරද්දි යම් මුදලක් අය කරන්න ඕන ඒක වැරදි නැහැ මේ දෙක අතර සමතුලිත තාවය ඇති කරගන්න බොහෝ විට මුදල් උපයන පැත්තට තල්ලු වෙන්න පුලුවන් ඉඩ වැඩියි. ඒ නිසා නිශ්චිත ලෙස වෙන් කර ගන්න ඕන නිරෝධානය කරපු අයට මුදල් අය නොකොට කරන ඒක බාධාවක් නොවි කරගෙන යන්න. අපි හැම තිස්සෙම දකිනව මුදල් කියන සාධකය ආපු ගමන් සියල්ල තල්ලු වෙලා යනවා එ පැත්තට මෙන්න මේ අවදානයෙන් මේක කරන්න. අනිත් ඒක 2(5) කරුණ මහ සභාවට තීරණයක් ගන්න තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ. මුදල් කමිටුවට සහ මේ කමිටුවට මේ කරදියාන වත්ත එනවා. මන්ත්‍රීවරුන්ගේ අදහස් මතු කර ගන්න ඕන නිසා තමයි සභාවට පෙන්ලා දුන්නේ. සභාවේ අදහස් ගන්න ඉන් අනතුරුව අපේ අදහස් කියන්නම්.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,අංක 2(5) කරදියාන කසල අංගනයට කසල බැහැර කිරිම සම්බන්ධව අපි දිගින් දිගටම සාකච්ජා කලා.2016.08.01 දින ගිවිසුම් ගත වුන 2016 මාර්තු මාසයේ ඒක වැරදි ගෙවිම් සහගත නිසා ආන්ඩුකාරතුමා ඒක නැවැත්තුවා. ගරු කොමසාරිස්තුමා ඒක නැවත ගිවිසුමක් සකස් කරලා තියෙනවා ඒ ගිවිසුම සම්බන්ධව මහ සභාවෙන් අපි තීන්දුවක් ගන්න සභාවට ඉදිරිපත් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කරදියාන කසළ අංගනයට කසළ බැහැර කිරිම වෙනුවෙන් අප විසින් ගෙවන මුදල සම්බන්ධයෙන් කාලයක සිට සාකච්ජාවට බඳුන් වන කාරණයක්. මේකේ ඉතිහාසය අරගෙන බැලුවත් අද වෙනකොට කරදියාන කසළ අංගනය ගැන අපිට දිපු චිත්‍රය තමයි මෙන්න මේ කාලය වෙනකොට කොම්පොස්ට් පොහොර නිපදවනවා. විදුලිය උත්පාදනය කරනවා මෙන්න මෙහෙම කිය කිය තමයි ගරු නගරාධිපතිතුමනි මෙපමණ කාලයක් ඇදිගෙන ආවේ. හැබැයි මුල් කාලේ අපි කසළ බැහැර කලේ නොමිලයේ පසුව තමයි සභාව යම් ගෙවිමක් කරලා කලේ. පසුව බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කලමණාකරණ අධිකාරිය මේක පවරාගෙන අපේ මුදල් ගන්න ගත්තේ පසුව අපේ බලාපොරාත්තුවක් තිබුණා යම් ක්‍රමවේදයකට මේක ක්‍රියාත්මක කරයි කියලා. නමුත් ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොටත් ඒක ඒහෙම තත්ත්වයක නොවෙයි තියෙන්නේ. 2006 වකවානුවේදි මේක මීට වඩා වෙනස් තත්ත්වයකට පරිවර්ථනය වුනා. ඒ හින්දා තමයි අපි දිගින් දිගටම ඉල්ලිම කලේ ගරු නගරාධිපතිතුමාගෙන් සභාවේ මුදල් සභාවේ අනුමැතියක් නැතුව ගෙවනවට අපි කැමති නැහැ. ඒහෙම ගෙවිමක් කලොත් ඒකට අපේ සභාව නගරාධිපතිතුමත් අපිත් මන්ත්‍රිවරු විදියට යම් අධිභාරයකට බලපානවා. ඒක ගරු නගරාධිපතිතුමනි, බරපතල කාරණාවක්. හැබැයි දැන් ගිවිසුමකට යන වෙලාවෙත් අපේ ප්‍රශ්නය තමයි දැන් ඒ කියන ක්‍රමවේදය මොන ආකාරයෙන්ද සිදු වෙන්නේ. දැනට අපට තියෙන ආරංචිය තමයි පසුගිය දවස්වල පුවත්පත් වලත් අපි දැක්කා ඝණ අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරිය තවත් බාහිර පාර්ශවයකට මේක දෙන්න යනවා. පුද්ගලික සමාගමක් හරහා තමයි ක්‍රියාත්මක කරන්න

යන්නේ. පුද්ගලික සමාගමක් නම් ක්‍රියාත්මක කරන්න යන්නේ අපි සභාව විදියට සාකච්ජාවක් හෝ බැදිමක් ඇතිකරගන්න ඕන ඒක පවත්වාගෙන යන අයත් ඒක්ක. ඒතකොට ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මැද ඉදගෙන අපෙන් මුදලක් අයකරන්න කියලා අපිට දිගින් දිගටම බලපෑම් කරනවා මුදල් ගෙවන්න මුදල් ගෙවන්න කියලා. හැබැයි ඒගොල්ලෝ කරන කටයුත්තකුත් නැහැ. මට තේරෙන විධියට මම වැරදි නම් ගරු නගරාධිපතිතුමා නිවැරදි කරන්න. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, සභාව මේක දීර්ඝ වශයෙන් සාකච්ජා කරන්න ඕන. ඔබතුමා සහ කොමසාරිස්තුමා තමයි මේ සාකච්ජාවට යන්නේ එම නිසා ඔබතුමා දන්න කරුණු වලින් අපිව දැනුවත් කරන්න. අපි සොයා ගත්තු කරුණු තමයි කියෙන්නේ. ඒමනිසා ඝණ අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරිය අපිට කිව්වට ඒ අයට මුදල් ගෙවන්න කියලා මේ වෙනකොටත් කරපු දෙයක් නැහැ. ඉදිරියටත් කරන දෙයක් අපට පෙන්නේ නැහැ. ඒමනිසා සභාව පුළුල්ව සාකච්ජා කළ යුතුයි. කියන ඒක තමයි අපේ අදහස.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මේ ගිවිසුම සම්බන්ධයෙන් කථා කරනකොට පොඩ්ඩක් අතීතයට ගිහිල්ලා එන්නට වෙනවා. ඒහෙම නැත්නම් මේක පිළිබදව ඔබතුමාලගේ මතය නිවැරදි කර ගන්න අපහසු වෙන නිසා. 2016 ජුනි මස 30 වන දින මහා නගර සභාව විසුරුවා හරිනවා. ඒතකොට මේ මහා නගර සභාවේ කසළ ගෙවිම් කිරිම සිදුකළේ දිරන කසළ සඳහා නොමිලයේත් සියලුම අනිත් නොදීරන කසළ සදහා ටොන් එකකට රු.500/- කුත්. මේකේ වැඩි විමක් සම්බන්ධව දිගින් දිගටම එවපු නිසා එවකට පැවතුණ යහපාලන රජයේ ඒක්සත් ජාතික පක්ෂයේ භාණ්ඩාගාරික විදියටත් මුදල් රාජ්‍ය අමාත්‍යවරයා විදියටත් තවද මැක්සි පෙරාඩ් ප්‍රනාන්දුටත්, අතුල පීරිස් මන්ත්‍රිතුමාටත් , කුලරත්න පීරිස් මන්ත්‍රිතුමටත්, සුනිල් නන්දසිරි මන්ත්‍රිතුමාත් මේ පිලිබදව දන්නවා. මේ පැත්තට ගෙනල්ලා දැනට ආණ්ඩු පක්ෂය තියෙන කාර්යාලයට ගෙනල්ලා මම කිවුවා මේක අනිවාර්යෙන්ම ඔයගොල්ලෝ දිනනවා මේ සභාව. හැබැයි ඔයගොල්ලන්ට දරාගන්න බැරි මුදලක් වැඩි වෙන්න යන්නේ ඒක නිසා කරුණාකරලා මේකට ඒකඟතාවය දෙන්න යන්න ඒපා කියලා මම කරුණු පැහැදිලි කිරිමක් කළා. නමුත්, අවාසනාවකට මේක විසිරෙව්වා. මුදල වැඩි වීම අගෝස්තු මාසයේ පළවෙනිදාට සිට මුදල වැඩි වෙන්නාවූ ගිවිසුම ගියා. ඒතනදි රු.500/- කියන ඒක රු.3000/- ක දක්වා වැඩි වුනා. සමහර රු.500/- කියන ඒක රු. දෙදහස් ගාන දක්වා වැඩි වුණා.සමහර රු.500/- කියන ඒක රු. 1000/- දක්වා වැඩි වුණා. නොමිලයේ දෙන ඒක 250/- දක්වා වැඩි වුණා. මේ ආකාරයෙන් වැඩි වෙලා සාමාන්‍යයෙන් උපරිමයට ගිහිල්ලා ලක්ෂ 13 ක් ගෙවපු අපිට ලක්ෂ 28, 29, 30 දක්වා ගෙවන්න වුණා. මේ වැඩි විම ඒම ගිවිසුමට ඇතුළත් වෙලා තිබුනේ 2016 අගෝස්තු මාසයේ පලවෙනිදා ඉදලා හැබැයි හිටපු කොමසාරිස්තුමා ඒය මාර්තු මාසයේ සිට ගෙව්වා ඒතන ලක්ෂ 67 තියෙනවා වැඩිපුර ගෙවිමක්. ගිවිසුම ක්‍රියාත්මක වෙන්න ඕන අගෝස්තු මාසේ පළවෙනිදා සිට ආපස්සට ඇවිල්ලා මුදල් ගෙවුවා. කොහේවත් මෙම ගෙවිම මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක වෙනවා කියලා ක්ලෝස් ඒකක්වත් නැහැ. ඒක බරපතල ප්‍රශ්නයක් වුනා.

හැබැයි කුණු දාන්නත් නැති නිසා මම ගිවිසුමකට එළඹිලා නැහැ 2006 සිට. හේතුව කරදියාන කසල අංගනය කියලා කියන්නේ අපේ හිටපු ගරු දිලිප් කුමාර සෞඛ්‍ය කමිටු සභාපතිවරයාගේ මැදිහත් විම තුළ එවකට ඒ.ටී.කේ.චන්ද්‍රදාස මහත්මයාගේ කාල වකවානුවන් තුළදි සොයා ගත්ත ස්ථානයක්. ඊට පසුව රවිනාත් ගුණසේකර මැතිතුමා රු.16000/-දාන්න යනකොට දවසකට රු.188000/- වෙනකොට මාසයකට හාරලක්ෂ පනස් දාහ කලේ අපි විපක්ෂ මන්ත්‍රිවරු

ඉන්නකොට. අපිට මේ පිලිබඳව පොඩි වැටහීමක් තිබුනා. මේ පියදාසගේ වත්තක් කියනකොට, පියදාසගේ නොවෙයි සිරිමාවෝ ආර්.ඩී.බණ්ඩාරනායක මැතිණිය මීරිදිය මසුන් ඇතිකිරිම සහ බෝග වගා කිරිම සඳහා පියදාසට දිපු ලියවිල්ලක් කියලා ඒකත් සොයාගෙන ඔප්පුව බවට පරිවර්ථනය කරලා අක්කර 25 ක් රජයට පවරා ගන්න සණඅපද්‍රව්‍ය කළමනාකරනයට පවරා ගන්න කාර්ය පවා අපි කලා. ඒකට දිලිප් කුමාර ගරු මන්ත්‍රිතුමත් අපිත් මේ සත්භාවයෙන් මේ කටයුතු කරගෙන ගියා. මේ වත්ත පිළිබඳව ගිවිසුම් නැතිව කුණු දැම්මේ අයිතිකාරයා බවට පත්වෙලා තිබුනේ මොරටුව මහ නගර සභාව. ඊට පසුව රවිනාත් ජේ ගුණසේකර මැතිතුමා නිසාම අපි පාලකයෝ බවට පත්වුනාට පස්සේ මේ වත්තට කුණු දැම්මට පුලුවන් කම ලැබුනේ ඒතුමා විසින් ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා ඒතකොට අපිට ආණ්ඩුව ඇවිල්ලා ඒතුමා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා ඉන්න කාලේ අපේ U.D.C. ප්‍රනාන්දු මහත්මයා කොමසාරිස් වෙලා ඉන්න කාලේ ගිවිසුමකට ඒළඹුන නිසා හයිකෝට් ඒකේ පවා පිලිගත්තා වැඩ සටහනක් තියෙන ඒකම මහ නගර සභාව මොරටුව මහා නගර සභාව කියලා කුණු දාන ඒක නවත්වන්නේ නැතුව මේ වැඩේ දිගින් දිගටම කරගෙන ගියා. මේ අතීතය.

නමුත් වර්තමානයට ඒනකොට දැන් අපිට සමහර ඒවා රු.3500/- දක්වා ගිහිල්ලා තියෙනවා පූර්ණ ප්‍රතිශක්ති නොකරන ලද නිකර අපද්‍රව්‍ය කියලා දාලා 2500/- ක් දැන් මේ රු.500/-ට අපිට එවපු ඒක 2500/- වෙලා. හතරපස් ගුණයකින් වැඩිවෙලා. දැන් මේකට සාපේක්ෂව වැඩි විමත් ඊට එහා මාස 6 ක් ආපස්සට හැරිලා මුදල් ගෙවිමත් කියන කාරනා දෙක මුල් කරගෙන මම මේ ගිවිසුමට අත්සන් කිරිම දිගින් දිගටම පැහැර හරිමින් තමයි මේ කටයුත්ත කලේ. මේක මටම වුන නිසා පොඩි චාන්ස් ඒකකුත් වුණා මොරටුව මහා නගර සභාවට එය තමයි ගරු නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමාට මේක මතක ඇති සිකියුරිටි එක ප්‍රයිවට් ආයතනයකට දෙද්දි අපි ටෙන්ඩර් කරන එකටම අපේ කොන්දේසිත් දාලා තමයි ටෙන්ඩර් කලේ. ඒතකොට A.T.K. චන්ද්‍රදාස මහත්මයාගේ ඉදලා ආනන්ද කුසුම්සිරි මහත්මයා රවිනාත් මහත්මයා මේ ඔක්කොම එක්ක මාත් කළේ මේ ක්‍රියාදාමයමයි. නමුත් අවසානයේ යහපාලන ආණ්ඩුවක් ඒනකොට ගිවිසුම සභාගත නොකර තිබිම නිසා මට කොමිෂන් එක්ක පත් කලා ලංකාවේ ආයතන 343ක් තියෙනකොට මට විතරක් කොමිෂන් එකක් පත්කරලා මාව වැරදිකාරයෙක් කරලා ධූරධාරිත්වය නැති කරන්න හැදුවා. මම බොහොම අමාරුවෙන් ඒකත් ඒක්ක ගිහිල්ලා ගිහිල්ලා අවසානයේ තිලකසිරි මන්ත්‍රිතුමා එක්ක දෙතුන් පාරක් අලුත්කඩේ මහා අධිකරණයට ගියා. මම බොහෝම අමාරුවෙන් ඒකෙන් ගැලවුනේ. මම ඒගොල්ලන්ට කිව්වා ගිනි පෙනෙල්ලෙන් බැට කාපු මම කණාමැදිරි එළියට බයයි. ගිවිසුමක් නැතිව මම මුදල් ගෙවන්න කැමති නැහැ. දැන් ඔබතුමන්ලා මට පැවරුවා නම් මගේ ධූරධාරිත්වය නැති කරන්න කොමිෂන් සභාවක් ඇයි මගෙන් සල්ලි ඉල්ලන්නේ මේ ක අනිත් සභා වලට වලංගු වෙන්නේ නැහැ. ඒ සභාවල් වල ධූරධාරිත්වය නැති කන්න කොමිෂන් ඒකක් පත් කලේ නැහැ මට විතරයි ඒක කරලා තිබුනේ.ඒ නිසා මම කිව්වා මේකට මට ඒකඟ වෙන්න බැහැ මම ඒකඟ වුනත් මගේ ගරු මන්ත්‍රිවරු ඒකඟවෙන්නේ නැහැ මොකද හේතුව ගිවිසුම් නැති ඒකකට මුදල ගෙවලා අනිවාර්යෙන්ම අධිහාර එන්නේ අත උස්සන සියල දෙනාට මා ඇතුලුව. මම කිව්වා හරි ඒකඟතාවයකට එන්න.

ඊට අමතරව ගරු නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා, තිසර මෙන්ඩිස් මන්ත්‍රිතුමා, අපේ විපක්ෂයේ මන්ත්‍රිවරුත් / පක්ෂයේ මන්ත්‍රිවරුත් ගරු සෞඛ්‍ය කමිටු සභාපතිතුමා මේ සියලු දෙනාගේ අවධානයට යොමු කරන්න ඕන දැනට සති දෙකකට කලින් අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරියට රජය කැබිනට් තීන්දුවක් ගත්තා ඔවුන්ට විදුලි උත්පාදනය කිරිම සඳහා වෙනත් ආයතනයකට කසළ ලබාදිලා විදුලි උත්පාදනය කිරිමේ වැඩ සටහනක් කරදියානෙ කරන්න. දැනට කෙරවල

පිටියේ කරන ඒකට රෝසි සේනානායක මහත්මිය අපි ඉල්ලීම කරපු නිසා අපිට කියලා තියෙනවා නොදිරන කසල ගෙනල්ලා දෙන්න නොමිලයේ ගන්නවා කියලා. මට තියෙන ප්‍රශ්ණය තමයි මෙතන ගිවිසුමක් එවලා නොදිරණ ද්‍රව්‍ය වලට 3500/- ක් ගානක් දාලා වෙනම කැබිනට් ඒකකින් අනුමැතිය දීලා තව තැනකට යනකොට මේ ගිවිසුමට අපිට කොහෙත්ම අත උස්සන්නත් බැහැ මේක ගැන කථා කරන්නත් බැහැ. ඒ නිසා මම ඒගොල්ලන්ව දැනුවත් කලා මේක පරස්පරයි. මෙහෙම ගනුදෙනු වලට යන්න බැහැ. මෙහෙම ගනුදෙනුවලට යන්න පුලුවන් විදියට කටයුත්තක් මේ ගිවිසුමේ නැහැ. ඒහෙම නම් අපිට ඒ දෙගොල්ලෝ අතර එකඟවූ ගිවිසුමේ කොපියක් ඒවන්න ඊට පස්සේ අපිට පුලුවන් අපේ කුණු නොමිලයේ ගන්නවා කියලා ක්ලෝස් ඒකක් දාගන්න ඕන මේකට. දැන්ට අපේ දවසට ටොන් 65-70 ක් ගිය ඒකේ දැන් ටොන් 6 ක් විතර තමයි එන්නේ ඒවා අපි කෙරවලපිටියට දෙන්න අපි සැලසුම් හදලා වාහන දෙකකුත් ලැස්ති කරලා තියෙන්නේ. ඒක නොමිලයේ ගිහිල්ලා දාන්න පුලුවන්. මෙතනට අපි සල්ලි ගෙවලා දාන්න ඕන නැහැනේ. අනික මේතන දාන්න ඕන විදුලිය උත්පාදනය කරනවා නම් ඒවා නිකං ගන්න ඒපැයි. ඒහෙම ක්ලොස් ඒකක් මෙතන නැහැ.මම මේ සාරාංශය කිව්වේ. මගේ 47 දෙනෙක් මෙතන ඉන්නවා මම හැර.47 දෙනාම පක්ෂ වුනත් මම පක්ෂ වෙන්නේ නැහැ මේ වැඩේට. හේතුව මම අකරතැබ්බකට මුණ පාලා තිබුනේ ගිවිසුමක් සභාවට දාලා සභාවෙන් සම්මත නොවිච්ච ඒකකට මට කොමිෂන් ඒකක් පත් කරපු නිසා නැවත වතාවක් අපි ඔක්කොටම කොමිෂන් ඒක පත් කරලා සභාවම විසුරුවා හරින්න මේක ඒක හේතුවක් වෙයි. හේතුව සභාව ගිවිසුමකට එළඹ නැතුව මුදල් ගෙවීම මත වෙන්නේ

ඊලඟට මම කිව්වා දැනට අපෙන් වැඩිපුර මුදල් අරගෙන තිබෙනවානේ ඒ මුදල් 2016 සභාව විසිරීමට පෙර තිබුන මුදල් වලට හිලව් කරලා ඔබතුන්ලට දැන් වෙනවා නම් මෙච්චර මුදලක් අන්න ඒකත් කථා කරලා මම ගිවිසුමකට ඒන්නම් ඒ ඇරෙන්න ගිවිසුම් වලට මට එන්න බැහැ. කුණු දාන්න දුන්නේ නැත්නම් මම බලෙන් කුණු දානවා. ඒක මගේ අයිතිය මම බලෙන් හරි දානවා. සාකච්ජාව මම කලේ වෙන මුකුත් නිසා නොවෙයි සභාව නිසා. මේ සභාවේ සියලු දෙනාගේ කැමැත්ත නැත්නම් අඩුම තරමින් ආණ්ඩු පක්ෂයේ කැමැත්ත නැත්නම් මේ ගිවිසුමට යන්න බැහැ. මම කියන්නේ ඔයගොල්ලේ කැමති වුනත් මම මේකට කැමති වෙන්නේ නැහැ. හේතුව තියෙන්නේ මේක මහ බරපතලයි. මේ ගිවිසුමේ අඩුපාඩු ගොඩක් තියෙනවා. ඒවා ඔක්කොම හදාගන්න ඕන. ඒහෙම නැතුව අපිට මේකට යන්න බැහැ. ඒක පැත්තකින් කැබිනට් ඒක කියනවා අර සමාගමත් එක්ක යන්න කියලා. අනිත් පැත්තෙන් අපිට කියනවා නොදිරන කසළ ගන්න ටොන් ඒකකට රු.3500/ යි. ඒහෙම ඒකකට අපිට යන්න බැහැ. මේක වැරදි පූර්වාදර්ශයක් දෙන්න යන්නේ අපිට උඩින් ඉන්න ආයතනයක් අපිට බලපෑමක් කරන්නේ. ඒ බලපෑමට අපිට නතු වෙන්න බැහැ. මේක ක්‍රියාත්මක කරන්නත් බැහැ. ඒම නිසා මේක නිවැරදි කර ගන්න තියෙන්නේ අර ලක්ෂ 67 ගිවිසුමක නැති මුදලක් ගෙවීම සම්බන්ධව අද වෙනකම් කථා කරන්නේ නැහැ මම මාර්තු මාසේ 27 වන දින නගරාධිපති වුනාට පස්සේ අප්‍රේල් මාසේ ගිහිල්ලා කථාකරලා කිව්වේ මම මගෙන් වැඩිපුර ගත්ත ලක්ෂ 67 දෙන්න ඉක්මනට. තව වෙනකම් ලක්ෂ 67 ගැන කථාවක් නැහැ.

ගරු මන්ත්‍රීවරුනි, අනිත් ඒක මේක නිවැරදි කර ගැනිම සඳහා අපි කමිටුවක් පත්කර ගෙන සාකච්ජා කර ගත යුතුයි. ඒම කමිටුවට නීතිඥයෝ ගෙන්වා ගත යුතුයි. ඒ කමිටුවෙන් තීන්දුව ඉදිරියට යන්න ඇරෙන්න මේ වෙලාවේ අපි සාකච්ජාවක් කරලා ඒකාබද්ධ ස්ථාවර කාරක සභාවක් පත් කරලා, එම කාරක සභාවෙන් ගන්න තීරණය නැවත සභාවට ඉදිරිපත් කරලා

සභාවෙන් තීන්දුවක් විදියට පලාත් සභාවට යවනවා ඇරෙන්න වෙන විකල්පයක් නැහැ කියලා මම විශ්වාස කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙතනදි අපි මූලික වශයෙන් එකඟතාවයකට ආවානේ සීරෝවේස්ට් කරන තරමට අපෙන් අය කරන්නේ නැහැ කියලා ඒ කියන්නේ හීන වෙන ශේෂ ක්‍රමයට ගිහිල්ලා ඔක්කොම කපා හරිනවා කියලා. ඒ සම්බන්ධයෙන් වුණ සාකච්ඡා වලදි මූලික ගිවිසුම් වලදි වුණා එකඟතාවය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පිළිගන්නේ නැද්ද ක්‍රියාත්මක වෙන්නේ නැද්ද කියන ඒක නැහැ. මුල් ගිවිසුම් වලදී තිබුනනේ ඒතකොට ඔබතුමා කියන කාරණාවේ සත්‍යතාවයක් තියෙනවා. ඊළඟ කාරණාව කෙලවරපිටිය මහ නගර සභා අමාත්‍යාංශයෙන් හදපු ඒක වගේම ඒකට සාපේක්ෂව චම්පික ඇමතිතුමා මෙතනත් පටන් ගත්තා. ඒකත් ගත්තොත් ඒහෙම අපිට මේ කටයුත්ත ඉක්මන් කර ගන්න පුලුවන්. අපි ආණ්ඩුවටත් අනිත් කටයුතු වලටත් බලපෑම් කරන්න ඕන ඒකක්. අනිත් ඒක දඹුල්ල, ගාල්ල හෙට අනිද්දා විවෘත වෙනවා 2017 ආරම්භ කසල අංගන ස්ථාන 9 ක. ඒ අනුව ඔබතුමා මොරටුවෙ බලාපොරොත්තු වෙන වැඩේ ඒ හරහා යමක් කර ගන්න පුලුවන් නම් හොඳයි. ඒහෙම තියෙද්දි අපෙන් රු.3500/- ක් ඉල්ලන ඒක සාධාරණ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙම කාරණාවට අදාළ අපහැදිලි තැන් කීපයක් තියෙනවා. අදාළ ව්‍යාපෘතිය සඳහා කරදියාන වත්තට කසළ දැමීම සඳහා අපි ගෙවීමක් තියෙනවා හිඟ ලෙස. මෑතකදි පලවුන මාධ්‍යකට අනුව කෝටි 5 කට වගේ ගානක්. ඔබතුමා කියනවා අපෙන් වැඩිපුර අයකර ගත්තු ගණනක් ලක්ෂ 67 කට අදාල කාරණාවක්. ගරු නගරාධිපතිතුමනි, මේ ප්‍රශ්ණය අවසාන වශයෙන් බලපාන්නේ අපට නිසා අපි ජනයාගේ කසළ ටික ඉවත් කිරිමට අදාල ක්‍රියාමාර්ගයක් අනිවාර්යයෙන් ගත යුතුමයි. දැන් ඔබතුමා කියන කාරණාවට අනුව ඒකතුවන කසල ප්‍රමාණය වර්ගිකරණය කර ගත්තම මේ ගිවිසුමට අදාලව කියන මිල ගණන් වලින් තොරව දිරණ කසල දෙන්න පුලුවන්. කෙරවලපිටිය අපට ඒ වගේ අවස්ථා දැනට හැදෙමින් තියෙනවා. ඒවැනි තත්වයක් තුළ අපි ගිවිසුමකට යන ඒක අවාසියක් තියෙනවා. මේ ගිවිසුම අගෝස්තු මාසේ අත්සන් කළා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, 2016 අගෝස්තු මාසයේ අත්සන් කලේ හිටපු කොමසාරිස්තුමා තමයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ 2021 දින අගෝස්තු 15 වන දින බත්තරමුල්ල දි අත්සන් කරන ලද

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, නැහැ අපි අත්සන් කරලා නැහැ.ඒක තමයි ගිවිසුමේ තිබෙන දූර්වල කම් සාකච්ඡා කරන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි පැහැදිලිව අත්සන් නොකර අත්සන් කරන ලදි කියන ඒක බරපතල වරදක්නේ. මම පෙන්වා දුන්න 4(3) තිබෙනවා මෙම ගිවිසුමේ කොන්දේසි සහ නියමයන් 2021.08.01 වන දින බලාත්මක වන ලෙසද මේ සම්බන්ධයෙන් මිට සමගාමීව ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය හුවමාරු මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ඇතිකර ගත්තාවූ බැදීම් හා වගකීම් සියල්ල මෙතැන් පටන් බලාත්මක වන අතර, කෙසේ නමුත් මෙම ගිවිසුමේ අඩංගු කාරණ සම්බන්ධයෙන් මින්පෙර ඇතිකර ගත්තාවූ බැඳීම් වගකීම් සියල්ල මෙතැන් පටන් ශුන්‍ය හා බලරහිත වන බව ඒ වගන්තිය ඇතුලේ තිබෙන්නේ ඒගොල්ලෝ අපට ගෙවන ඒකත් අපි ඒගොල්ලන්ට ගෙවන ඒකත් ඉවරයි. ගෙවීම් පිළිබද ප්‍රශ්ණය මේ වගන්තියෙන් ඉවර මගේ අවබෝධය අනුව සියල්ල අවසන් වෙනවා. දැන් අපට තිබෙන්නේ මෙය තෝරා ගැනීම ඇතුලේ අපිට නොමිලයේ ලබා දෙන්න පුළුවන් ඉඩකඩ තිබෙන කසල ප්‍රමාණය පුලුවන් කම තියෙද්දී අපි ගෙනල්ල දෙන්න ඕන නැහැ. ගිවිසුම සම්පූර්ණ ප්‍රතික්ෂේප කරනවා වෙනුවට නැවත සාකච්ඡා කොට අපිට රෝසි සේනානායක මහත්මිය කියන ස්ථාන, කෙරවලපිටිය ස්ථාන අපිට ස්ථාවර ලෙස පිළිගත හැකි මට්ටමක තියෙනවද?

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔතන තියෙනවා කළමනාකරණ මධ්‍යස්ථාන හුවමාරු මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ඇති කර ගන්නා වූ බැඳීම් හා වගකීම් සියල්ල මෙතැන් පටන් බලාත්මක වන අතර ඒක අදාළයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒක පැහැදිලියි නේ. මේ ගිවිසුම මෙතැන් පටන් බලාත්මක වන අතර කෙසේ නමුත් මෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් මින් පෙර ඇතිකරගත්තාවූ බැදීම් හා වගකීම් සියල්ල මෙතැන් පටන් ශුන්‍ය හා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, බාධා කරනවා නොවෙයි, අපේ බැදීම් තිබුණානේ. අපි මේ දක්වා මුදල් ගෙවලා නැහැ. ඒ සියලු දේවල් ශුන්‍ය වෙලා මෙතැන් පටන් තමයි

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නීතිමය ප්‍රශ්ණයක් තියෙන්නේ. මේ ගිවිසුමේ අලුත් මිල ගණන් දිල තිබෙනවා. ඒගොල්ලො කියනවා දැන් මේක බලාත්මක වෙන්නේ කියලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.ඒම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක බොහොම වැදගත් ලියවිල්ලක්. අපි මේ සම්බන්ධව මෙහෙම කථා කරලා හරියන්නේ නැහැ. තැනින් තැන කථා කරලා විසදෙන්නේ නැහැ. මිට වඩා හොඳින් අධික්ෂණය කරලා විසඳා ගමු.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එතුමා කථා කරපු කරුණු වලට මම ඒකඟයි. කමිටුවක් දාලා කරන්න. මම මේ සම්බන්ධව අධ්‍යයනය කළා. මට දැනුණ දෙය තමයි මේ ගිවිසුම ඇතුළේ අපිට සැලකිය යුතු වාසිදායක තත්ත්වයක් තියෙනවා. ඒය අපි මතුකරගත යුතුයි අඩුපාඩු කම් ටිකක් තිබෙනවා ඒ ටික නිවැරදි කරගෙන. අනතුරුදායක අවිශ්වාසදායක අපට තවම ස්ථාවර නොවුනු තැන් පිළිබඳ විශ්වාසය තියලා මේක අත්ඇරියොත් මේගොල්ලන්ට තියෙයි බයක් අපි කසළ දෙන ඒක නතර කළොත් ඒගොල්ලන්ට යම් පාඩුවක් සිද්ධ වෙනවා. අපි වෙන වෙන තැන් සොයා ගත්තොත්. ඒ නිසා ඒගොල්ලන්ට සිද්ධ වෙනවා අපේ පරණ ගෙවීම් පිළිබඳව නොසලකා අපිව තවදුරටත් මේක පවත්වා ගැනීම සඳහා නැත්නම් මෙවැනි කොන්දේසියක් ඇතුළත් කිරීම ඒගොල්ලන්ට සාධාරණ වෙන්නේ නැහැ. අපිව දිගටම පවත්වා ගත යුතුයි මොකද අපෙන් යම් මුදලක් ඒගොල්ලෝ ලබා ගත යුතුයි ඒ මුදල ඉදිරියට ඒගොල්ලෝ ලබා ගන්න මිසක් පරණ හිඟ ගැන කථා කරල අපිව මෙතනින් අයින් කර ගන්න නොවෙයි. මට හිතෙන ඒක. මේකෙන් ඒක පාරට ඉවත්වෙන්නේ නැතිව මේ පිලිබඳව තවදුරටත් අපි අධ්‍යයනය කරලා අපි බලමු. ඒගොල්ලෝ උත්සහ කරනවා නම් ඒ පැත්තට මේක වාසිදායක ලෙස හරවා ගන්න අපි සමත් වෙන්න ඕන අපේ පැත්තට වාසි දායක තත්ත්වයක් කර ගන්න. 4(3) වගන්තිය ඔබ අර්ථ නිරූපනයක් ගන්න නීති අංශයට කියලා මේකෙන් පරණ බැඳීම් සියල්ල ශුන්‍ය වෙනවා කියන ඒක තමයි මගේ අවබෝධය.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක ඇත්ත වශයෙන්ම, ලක්ෂ හැට ගණනක් අපිට ගෙවන්න තියෙනකොට අපි ගෙවන්න ලක්ෂ විසි ගානක් තමයි තේරෙන විදියට මීට පෙර සභාවට ඉදිරිපත් කරපු ඇමුණුම එක්ක බලන කොට අධිකාරිය විසින් සභාවට ගෙවන්න ඕන තත්ත්වයක් තමයි තියෙන්නේ. මේකේ සියලුම වගන්ති නීතිවේදීන් සමඟ සාකච්ඡා කරලා ඒ උපදෙස් පරිදි අපිට වාසිදායක වෙන පරදි අපිට මේකට විකල්ප ආයතන තියෙනවා ඒගොල්ලන්ට අවශ්‍ය කරන්නේ අපිව පරණ තැන හිර කරලා තියලා ඉදිරියට මිල වැඩි කරලා නැවත එගොල්ලන්ගේ ව්‍යාපාරයේ ලාභය සඳහා අපිව යොදා ගන්න. මේකෙදි අපි මීට වඩා සූක්ෂම ලෙස විශේෂ කමිටුවක් මේ සඳහා පත් කරලා අධ්‍යයනය කරලා තින්දුවක් ගමු.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මෙන්න මේක පොඩ්ඩක් සැලකිල්ලට ගත යුතුයි. විශේෂ කොමසාරිවරයාගේ කාර්යභාරය ඉටු කිරීම නගරාධිපතිවරයෙක්, මහජන නියෝජිතවරයෙකු විදියට ගන්නා ලද කාර්යභාරයයි ඒ කටයුතුයි අතර කිසිම වෙනසක් නැහැ. ඒ ලබා දුන්නු තැන ඉදලා ඒතුමා කුණු ඇදීම සඳහා කුණු කලමනාකරණය කිරීම හෝ කුණු ඇදීම සඳහා කුණු වත්තට ගෙන යාම සඳහා එතුමා විසින් ඇතිකර ගන්නා ලද ගිවිසුමේ තියෙන්නාවූ මහා බරපතල අඩුපාඩුවක් නිසා තමයි මේ ප්‍රශ්ණය මතුවෙලා තියෙන්නේ. තිසර මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා කියන විදියට බොහොම හරි. අතීතයට ගියාට පස්සේ අපි මුදල් ගෙවන්න ඕනම නැහැ මේ ගිවිසුම නොඒන්න. මම 2006 සිට මේ තාක්කල් වෙනකම්ම ගිවිසුමකට අත්සන් කරලා නැහැ. අර පීරියඩ් ඒක ඇරුනම කුණු දාලා තියෙන්නේ ගිවිසුමකින් තොරව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා අත්සන් නොකලේ මේ කාරණාව දන්නවා.ඔබතුමා ඇඳ-ඇඳ මෙපමන තාක් දුරට ආවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මට තියෙන ගැටලුම මේකයි. අපි මුලින්ම නොදිරණ කසල නොමිලේ ගන්නකොට කසල අංගනය කොම්පොස්ට් නිෂ්පාදනය කලේ නැහැ.හැබැයි දැන් මෑත කාලේ නිෂ්පාදානය කරලා බංගලදේශයට පවා යවනවා. බංගලදේශට පවා යවනකොට පනතේ වගන්තිය මොකක්ද කියලා පාඩම් නැහැ කියන්න. හැබැයි තියෙනවා පැහැදිලිවම කැලි කැසල සභාවේ ආදායමක් විය යුතුයි. ඒය සභාවේ පොදු ගිණුමට බැර විය යුතුයි. අපේ මහ නගර සභා ආඥාපනත අභිබවා කුමන ආයතනයක් ඒක්ක අපිට බැඳිමකට යන්න බැහැ. ඒතකොට ඒ ආයතනය කුණු වලින් මුදල් හොයන වෙලාවක මුදල් උත්පාදනය කරන වෙලාවක අපිට සල්ලි වලට කුණු දෙන්න බැහැ. ඒ ආයතනය පිටින් කරනවා නම්. ඒගොල්ලෝ පුරවන ඒක විතරක් කරනවා නම් අපිට පුලුවන් අපේ සේවාව ඔවුන් මේ කරන්නේ මුදල් ඉපයිමක් නොවෙයි කුණු කුණු ටික අරගෙන පුරවන ඒක විතරයි. ඒතකොට අපිට දෙන්න පුලුවන් ඒගොල්ලන්ට මුදල්. හැබැයි ඒගොල්ලෝ එක් උත්පාදනය කරලා ටොන් ඒකක් බර ගානකට බංගල දේශයට යවනකොට මාල දිවයිනට යවනකොට ඒතකොට මේ වගන්තිය අපි උල්ලංඝනය වෙනවා. ඒතකොට වරිපනම් ගෙවන කෙනෙක් ගිහිල්ලා කිව්වොත් අපි ගෙවන බදු ඔබට උවමනා විදියට ඔබ රිසිසේ පාවිච්චි කරලා තියෙනවා කියලා සභාවේ මන්ත්‍රිධුර ටික ඉවර වෙනවා. කාටවත් පුලුවන්කමක් නැහැ එසේ කරන්න. මම මේ කරුණු ඒකෙන් ඒක ඔක්කොම කියලා තියෙන්නේ. ඒ නිසාම මට මෙච්චර දුරක් ඒන්න දිලා තියෙනවා නැත්නම් මෙච්චර දුරක් යන්න දෙන්නේ නැහැ. මානප්පෙරුම කොමසාරිස්තුමා ඒකට අහුවුනා. එතුමා ඒකට අහුවෙලා වැඩි ගානකට ගිවිසුමක් ගැහුවා ආපසුසට ගිහිල්ලා ගෙව්මකුත් කලා. ඒ ගිවිසුමේ ඒල්ලෙන්න මට බැහැ. සභාවටත් බැහැ. ඒ නිසා ආපස්ට ඇවිල්ලා මුදල් මොනවද මුදල් ගෙවන් තියෙනවද කියලා අපි කමිටුවේදි දීර්ඝ ලෙස සාකච්ඡා කරලා තීන්දුවක් ගමු. සාකච්ජා කරලා හොඳ තීන්දුවකට යමු. ඒක ඓතිහාසික තීන්දුවක් බවට පත් වෙයි. මේ තීන්දුව ආවට ගියාට ගන්න පුලුවන් ඒකක් නොවෙයි.

2021.08.11 දින පැවති පරිසර හා සෞඛ්‍ය කමිටුවේ අංක 02(5) සඳහන් කරදියාන කසල අංගනයට අපද්‍රව්‍ය බැහැරලීමට අදාල ගිවිසුම්ගත වීම සම්බන්ධව නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කර ඇති අංක MMC/COM/01-V1 2021.08.02 දිනැති වාර්තාව හා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් එවා ඇති ගිවිසුම සම්බන්ධව (ඇමුණුම 03) තවදුරටත් **සලකා බැලීම සඳහා ආයතන හා නීතිය පිළිබඳ / ඉඩම් හා නගර සංවර්ධන පිළිබඳ / මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ / පරිසර, සෞඛ්‍ය සනීපාරක්ෂාව පිළිබඳ / ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ / කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ / ව්‍යාපෘති හා භෞතික සම්පත් කලමනාකරණය පිළිබඳ / ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ / මුදල් පිළිබඳ වූ විශේෂ ඒකාබද්ධ ස්ථාවර කමිටු රැස්වීමක් පැවැත්වීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**2021.08.11 දින පැවති පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(5) ට අදාල ඉහත සභා සම්මුතියට යටත්ව සියලු කමිටු තීරණයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06(5) 2021.08.11 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලීම.**

**2021.08.11 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06(6) 2021.08.12 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කමිටුවේ සඳහන්ව නැතත් කල්දමුල්ල සි.පි.ද සිල්වා මාවත යන්නම බැරි තත්වයක් වෙලා තියෙන්නේ, සුධර්මාරාම පාරත් ඒවගේමයි. එමනිසා ගරු නගරාධිපතිතුමනි ප්‍රිමික්ස් ටික්ක දාලා හරි අලුත්වැඩියා කර දෙන මෙන් කාරුනිකව ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පුංචි ඉල්ලිමක් සොයිසාපුර ප්‍රජාශාවේ තියෙන වැසිකිලිය පිරිලා බරපතල තැනක තියෙන්නේ ඒ ගැන සොයා බලා ඉක්මනින් ජනතාවට පාවිච්චි කරන්න පුලුවන් තත්වයට පත් කර දෙන්න කියන ඉල්ලිම කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා , දැනට නිවාස සංවර්ධන අධිකාරිය ඒම ස්ථානයේ ගෙවල් 100 ක විතර නිවාස සංකීර්ණ දෙකක් හදන්න යනවා. අපිට ඒගොල්ලා අංග සම්පූර්ණ ක්ලිනික් එක, ප්‍රජාශාලාව, පුස්තකාලය ලබා දෙනවා කියලා තියෙනවා. ඒමනිසා එතෙක් නඩත්තු කටයුතු කරන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටු වාර්තාවේ 3(1) සිට 3(51) දක්වා ඇස්තමේන්තු වලට පෙර සේම අපි විරුද්ධත්වය පල කරනවා. කාරණා දෙකක් තියෙනවා ඒකක් සමහර ඇස්තමේන්තු මේ වෙනකොට ක්‍රියාත්මක කරලා ටෙන්ඩර් ප්‍රදානය කරලා මුදලුත් ගෙවලා කියන ඒක තමයි පේන්න තියෙන්නේ ඒ නිසා මෙවන් තත්වයක් තුල අපි ප්‍රමුඛතා ලැයිස්තුවකින් තොරව, පොදුවේ ගත්තම පේනවා මේ වෙලාවේ අපිට කිසිසේත්ම ඒකඟ වෙන්න බැරි, මෙවන් තත්වයක් තුලා සෝපානයක් ගහනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රිතුමා, බාධා කරනවා නොවෙයි මේ සෝපානය කරන්න තිබුනේ ඉංජිනේරු දෙපාර්තමේන්තුව තට්ටු තුන කරනකොටමයි අද ලංකාවේ තියෙනවා තට්ටු දෙකට වැඩියේ යන

ගොඩනැගිලි අනුමත කරන්නේ නැහැ. ඒක නාගරික සංවර්ධන අධිකාරියේ තියෙන්නාවු නිර්ණායකයක්. අපි කරන්න ඕන කාලය පැනලා තියෙන්නේ මේක අත්‍යාවශ්‍ය ඒකක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, හරි ඒක ඔබතුමාගේ තීන්දුවනේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රිතුමා, මගේ තීන්දුවක් නොවෙයි රටේ තීන්දුවක්. දැන් ඔබතුමාට බිල්ඩින් ඒක්ක හදන්න තියෙනවානම් සෝපානයක් ඉල්ලනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඒ සඳහා නීතිමට ලියවිල්ලක් තියෙනවද?

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රිතුමා,නාගරික සංවර්ධන අධිකාරියේ නීතියක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එය සභාගත කරන්නකෝ අපිට. ඒ නිසා පොදුවේ ගත්තම මේ වෙලාවේ අදාල ඒවාට විරුද්ධ වෙන්නේ ඒ පදනමින්ම නොවෙයි. මේවායේ සියලු වැඩ කටයුතු අවසන් කර දිගින් දිගටම සභාව නොසලකා හැරීමක් ලෙස මම හැමදාම කියනවා ඇස්තමේන්තු ඉදිරිපත් කරන ඒක, කරන්න එපා කියලා නමුත් හැමදාම දිගටම සිද්ධ වෙනවා ඒ පදනමින් සහ අපි වියදම් දැරිය යුතු ආකාරයත් එක්ක තිබෙන ගැටලුවත් එක්ක එම ව්‍යාපෘති කිපයට අපේ විරෝධය පල කරනවා.

**2021.08.12 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දූ නිරෝෂණ මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |

| | | | |
|---|---|---|---|
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |

**මේ අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මහා නගර සභා මන්ත්‍රීවරු 2021.08.12 දින පැවති කර්මාන්ත කමිටු වාර්තාවේ අංක 03(1) සිට 03(51) දක්වා තීරණයන්ට විරුද්ධවත් අනෙකුත් තීරණයන්ට පක්ෂවත් ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2021.08.12 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**06(7) 2021.08.12 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

**2021.08.12 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තීරණ ඒකමතිකව සභා සම්මත විය.**

**06(8) 2021.08.13 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2021.08.12 මුදල් මම ඔබතුමාගෙන් ආයාචනයක් කරනවා නොමිලයේ ලැබෙන අවස්ථාවක් මට ආරංචි වුන විදියට මේ වෙනකොට ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් ආයතනය දියුනු කරන්න නිර්ණායක ඒහි අධ්‍යක්ෂක සුරංග මහතා විසින් සුම් වැඩසටහනක් ආයතන අටකට ලබාදෙනවා ඉදිරි මාස කිපය ඇතුලත. මොරටුව මහ නගර සභාවත් මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ලබාගන්න නිලධාරින් ඇතුලු ඒ සම්බන්ධව දැනුමක් තිබෙන අය සම්බන්ධකර ගන්න පුලුවන් වුනානම් අපිට මේ තිබෙන ඵලදායිතාව වැඩි කර ගැනිමට පුලුවන්. ඔබතුමා ට සම්බන්ධ වෙන්න අවස්ථාවක් තිබෙනවා නම් මට ඒහි සම්බන්ධීකරණය කරන්න පුලුවන්. විශාල මුදලක් වැය වෙන වැඩ වැඩසටහක් නොමිලයේ ලැබෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු කොමසාරිස්තුමා, එය සම්බන්ධීකරණය කරන්න.

**2021.08.13 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තීරණ ඒකමතිකව සභා සම්මත විය.**

**06(9) 2021.08.13 දින පැවැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

<u>මහ නගර සභා මන්ත්‍රී - එම් තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මුදල් කමිටුවේ කාරණා කිහිපයකට හැර අපි එකඟතාවය පල කරනවා. 9 13 18 26 හා 27 කාරණාවලට අමතරව අනික් කාරණාවලට අපි එකඟයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු විදියට මුදල් කමිටුවේ 9 13 18 ට විරුද්ධයි 26 27 ට අපි නිහඬයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

අපි කිව්වාම කාවද ගනන්ගන්නේ?

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාදිපතිතුමනි, සුදර්ශණී මන්ත්‍රීතුමියයි, මසිනා මන්ත්‍රීතුමියයි. මුදල් කමිටුවේ තියෙනවා බජට් එකෙන් ඇවිල්ලා 2022 අවුරුද්දේ බලපත්‍ර ගාස්තුවලට තක්සේරු අනුව අයකරගන්නා විධිය මුදල දැන් මේකේ කියනවා රු100යි 6000යි අතර රු 700 ක් ගන්නවා. නමුත් මේ අවසාන එක මම කියන්නේ 25000 ට වැඩි එවට 5000 යි එ කියන්නේ 25000 වැඩි එවට 5000 ද සිමාව යන්නේ ඊට වැඩියෙන් යනවාද?

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ඊට වඩා පනතින් එහා යන්න බෑ. පනතේ තියෙන්නේ උපරිම 5000 යි එතනින් එහාට යන්න බෑ. අපිට එක සංශෝධනය කරනකම් කොච්චර වටිනාකමක් තිබ්බත් 5000 එහා යන්න බෑ.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ ඩී නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ පළමුව බෙරගතයුතු ප්‍රධාන කාරණාව විධියට තිබෙන්නේ දැන් අපි රැස්වෙන්නේ සැප්තැම්බර් මාසේ මහසභාවට මේ සැප්තැම්බර් මාසේ මහසභාව ලෙස අපට මහ නගර සභා අඥාපනතේ 190 වේ ගරු නගරාධිපතිතුමා මෙන්න මෙහෙම කියන්නේ මහා නගර සභාවක සෑම සාමාන්‍ය රැස්වීමකදිම කලින් වූ වර්ෂයේ අවසානයේ සිට රැස්වීම පවත්වන මාසයට කලින් වූ මාසයේ අවසානය දක්වා මහ නගර සභා අරමුදල සම්බන්ධයෙන් වූ ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශයක් නගරාධිපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කල යුතුයි දැන් අපි සැප්තැම්බර් මාසයේ ඉන්නේ සැප්තැම්බර් මාසයට කලින් මාසය අගෝස්තු හැබැයි මේ මූල්‍ය වාර්තාව ජූලි එතකොට සැප්තැම්බර් මාසේ මහා සභාව විසින් කල යුත්තේ අගොස්තු මාසේ මුදල් වාර්තාව සලකා බැලීමයි. නමුත් දැන් අපිට ජූලි මාසේ මුදල් කමිටු වාර්තාව තමයි තියෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

මන්ත්‍රීතුමා අපි මහ සභාවට ගන්නේ අගෝස්තු මාසයේ මුදල් කමිටුව. අගෝස්තු මාසයේ මුදල් කමිටුව තමයි සැප්තැම්බර් මාසේට එන්නේ අගෝසතු මාසේ ලැබිම් හා ගෙවිම් එක අපිට ඉදිරිපත් කරන්න බෑ. අගෝස්තු මාසයේ මුල මුදල් කමිටුව තිබූ නිසා දින වකවානුව අපිට ගන්න වෙන්නේ ජූලි මාසේ ලැබිම් හා ගෙවිම් ප්‍රකාෂනය එතකොට ජූලි මාසේ එක ගන්න කොට අගෝස්තු මාසේට කමිටුවට අරගෙන ඉදිරිපත් කරේ සැප්තැම්බර් ඉස්සර අපි සභාව කලේ මාසය අවසානයේ එතකොට හරි දැන් සභාව කරන්නේ මාසයේ මුල.සභාව මාසයේ මුල කරන නිසා අපිට ජූලි මාසේ ලැබිම් හා ගෙවිම් අපිට ගන්න වෙන්නේ අගෝස්තු මාසේ කමිටුවට එතකොට එවන්න වෙන්නේ සැප්තැම්බර් මාසේ මහා සභාවට එක මට මොන විධියෙන්වත් වෙනස් කරන්න බෑ. එහෙනම් අපි සභාව ගෙනියන්න ඕන මාසයේ අන්තිමට.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ ඩී නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඔබතුමා යන්න මාර්තු මාසේ 4 වෙනිදා මහ සභාවට අප්‍රේල් මාසේ 1 වෙනිදා මහ සභාවට මැයි මාසේ 6 වෙනිදි මහ සභාවට එ සභාවල ඔබ ඉදිරිපත් කරලා තියෙන වාර්තා සන්සන්දනය කරලා බලන්න මම කියන කාරනාව සිද්ධ වෙලා තියෙන්නේ කොහොමද කියලා. ඔබ අර තර්කයනම් ඉදිරිපත් කරන්නේ මම ප්‍රධාන වශයෙන් ඔන්න ඔය ගැටලුව පදනම්

කරගෙන මගේ විරෝධය පල කරන ගමන් එ කියන්නේ එක්කෝ විශේෂිත හේතු තියෙන්න ඕන නැත්නම් අර්බුදයක් වෙන්න ඕන නැත්නම් මොකක් හෝ බැරිකමක් මොකක් හෝ ප්‍රකාශනයක් තියෙන්න ඔන මෙන්න මේ නිසා මේක ඉදිරිපත් කරන්නේ කියලා. ගරු නගරාධිපතිතුමණි අංක 3, 4, 5, 6, 9, 18, 19 යන අයිතම වලට අපේ විරුද්ධතාවය පලකරනවා. එවගේම අංක 7, 8, 10, 10 (1),(2),(3),අංක 14(1), අංක 16, 17, 20, 21, 22, 23, 24, 25, 26 (1),(2),අංක 27 (1) සිට අංක 27 (6) දක්වා, 28, 29, 30 යන අයිතමවලට අපි පක්ෂ වෙනවා අංක 13 (01) කාරණාවට අපි නිහඩ වෙනවා.

එ පිළිබදව ඉතා කෙටියෙන් යමක් කිව යුතුයි විරුද්ධවෙන්නේ ඇයි කියන කාරනාව එ පදනමේ තියෙන්නේ ගරු නගරාධිපතිතුමණි අපට ඉදිරිපත් කරනවා 3 යටතේ අපේ ජංගම ගිණුමේ ජූලි මාසයේ අවසානයේ පැවති බැංකු ශේෂය පිළිබදව දත්ත එ දත්ත සැලකිල්ලට ලක්කිරිමේදි ඉතාම පැහැදිලි අපිට අපේ ආයතනයේ ගණුදෙනුවල තිබෙන ස්භාවය අපි දිගින් දිගටම කිව්වා මෙවන් විශේෂිත වූ තත්වයක් මේ තත්වය ඇතුලේ අපි සැලකිල්ලට ලක්කරන්න ඕන ප්‍රධාන කාරණා දෙකක් එකක් කොවිඩ් වලින් බෙරේන්නේ කොහොමද අපේ තත්වය ඊට අදාල කරන නිරෝධාන නිතී රිතී පනවලා එ හරහා අද රට වහනවා අත හෝදනවා දුරස්ථභාවය තියා ගන්නවා එ සෞඛ්‍ය පැත්ත එ වගේම අනෙක් බලපෑම මේකේ ආර්ථික පැත්ත එ ආර්ථිකය කළමණාකරනය කිරිම ආයතනයකට විශේෂයි මේ වැනි ආයතනයකට පුද්ගලයින්ටත් විශේෂයි ආර්ථිකය කළමණාකරනය පැත්තේදි අපි ඉතාමත් තදින් ඔබතුමන්ලාට විවේචනයක් තියෙනවා මේ මොහොතට අනුව සලකලා නෙමෙයි මේ ආර්ථිකය කළමණාකරනය කරන්නේ මේ ගිණුමට අනුවත් ඔබ දන්නවා අපි ලක්ෂ 123යි පෙන්නන්නේ අපේ ශේෂය හැබැයි ඔබ හිතන්න මේ දත්ත වලට අනුව ණය පොලි වාරික කොච්චර ගෙවනවාද ගරු නගරාධිපතිතුමණි අප මිලියන 40 ණය ගත්ත එකට අදාළ ණය පොලි වාරිකය ලක්ෂ 34 ක් ගෙවනවා. දැන් මේ ගෙවාගෙන එනවා ඊළගට කැබ් රථ 04 ක් ගත්ත හින්දා අපි ගෙවනවා ණය පොලි වාරිකය 827000ක් එකතුව ගත්තෝත් ලක්ෂ 50 කට කිට්ටුවෙන්න අපි ණය පොලි ගෙවනවා. හැම මාසේම ඇයි අපි මේ ණය පොලි ගෙවන්නේ අපි මොකක් සදහාද මිලියන 40 ක් අරගෙන කලේ අද මේ කැබ් 04 මොන ආකාරයටද මේ සභාවේ යොදාගන්නේ කියන කාරණාවේදි අපිට බරපතල විවේචනයක් තියෙනවා. එනිසා එතනින් ඔබ්බටත් අපි තව දුරටත් මේ අත්‍යාවශ්‍ය නොවන වියදම් ඔබ ගියොතින් වියදම් සාරාංශ ඉදිරිපත් කරන ලේඛනයට වියදම් පැත්ත ගරු නගරාධිපතිතුමණි ඔබතුමා මොනවාටද වැඩිපුර වියදම් කරන්නේ සෞඛ්‍ය අංශයට රසායනාගාරයට මේ වෙලාවේ අත්‍යාවශ්‍ය සේවයක්නේ කොච්චර වියදම් කලාද රසායනාගාරයේ වාර්තා ඒන්නේත් නෑ. එ කියන්නේ සෞඛ්‍ය අංශය පැත්තේන් ගත්තෝත් වියදම් ඉතාමත් අවම වියදමක් මේ සභාවෙ දරන්නේ

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

මන්ත්‍රීතුමා, රසායනාගාරය පවත්වාගෙන යන්නේ කොහොමද මේ කලබල තියෙද්දි?

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ ඩී නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

නගරාධිපතිතුමනී, මේවගේ වේලාවක තමයි රසායනාගාරයක් වැදගත්

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ඔබතුමා කියන එක කරන්න පුලුවන්ද මන් අහන්නේ

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ ඩී නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට වඩාත් වැදගත් ජූනි මාසයේ ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා ලක්ෂ 26 ක් ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා ලක්ෂ 46 ක් දැන් මේකද වැදගත් අපිට මේවෙලාවේ ජූලි මාසයේ වාර්තාවලට අනුව ලක්ෂ 26 ක ගොඩනැගිලි ද්‍රව්‍ය ගන්නවා ලක්ෂ 46 ක් වියදම් කරනවා ගොඩනැගිලි නවීකරනය කරන්න මේ මොහොතට අදාලව අපි හිතනවා මේ අත්‍යාවශ්‍ය අපිට අනුව ඔබට අනුව ඔබ ගන්න මේ තින්දුව අපි එකග නැහැ කියන්නයි අපේ මේ පදනම කියන්නේ එ නිසා ගරු නගරාධිපතිතුමණි දිගින් දිගටම මේ වියපිහදම් ඇතුලේ මේ සභාව අර්බුදයට යනඑක නවත්වන්න බැහැ. එවගේම අනික් පැත්තේන් ඔබ දන්නවා ආණ්ඩුව පැත්තේන් ඉදිරිපත් කරන රටේ උගතුන් බුද්ධිමතුන් හැමොම කියනවා විශාල ආර්ථික ආගාදයක තියෙනවා කියලා. මේ මාසේ 06 වෙනිදා කොමසාරිස්තුමා දෙපාර්තුමේන්තු ප්‍රධානින්ට ලිපියක් ලියනවා එ ලිපියෙන් කියනවා ආයතනයේ සේවකයින්ගේ දිනක වැටුප කොවිඩ් අරමුදලට දෙන්න. රටක් විදියට අපි ඉන්නේ අර්බුදයක අපි එකට විරුද්ධ නෑ. අපි කවුරුත් සාමුහිකව එකතුවෙලා අවංකව කොවිඩ් මර්ධනය කරනවා නම් සේවකයෝ දිනක නෙමෙයි මාසේක හරි දෙයි හැබැයි අපි අහන ප්‍රවෘත්තිය මේ පැත්තේන් සෝපාන ඉදිවෙනවානම් අනෙක් පැත්තේන් ඉදිකිරීම් වෙනුවෙන් ලක්ෂ තිස් ගණන් නවීකරණය වෙනුවෙන් ලක්ෂ හතලිස් ගණන් මහජනයාගේ මුදල් වැය වෙන්නේ සේවකයා අහයි මොකටද අපේ දිනක වැටුප ගන්නේ එ නිසා තමුන්නාන්සේලාගේ මේන්න මේ වැරදි ආර්ථික කළමණාකරනය වෙනුවෙන් ගරු නගරාධිපතිතුමණි අපි අපේ විරෝධය පළකරනවා මේ තත්වය අදට වඩා හෙටට බලපායි. නිසැක ලෙසම අපේ ආදායම් පහල බහින එක වළක්වන්න බැහැ අතිශය බරපතල ලෙස ආදායම් පහල බහිනවා.

මම හැමදාම කටයුතු කලේ මේ සභාවේ යහපත වෙනුවෙන් මිස මම නිකන් විවේචනයට පමණක් මගේ කථාව යොමුකලේ නෑ මට ඊට වැඩිය බරපතල විවේචන තියෙනවා නමුත් එවා මං යටකරගෙන උත්සාහ කරනවා වෙනමොකක්වත් නෙමෙයි මේ ආයතනයක් ලෙස හෙට දවසේ ඔබද මමද මේ සේවකයෝද මේ මොරටුවේ ජනතාවද මුහුණදෙන්න නියමිත අර්බුදයෙන් කොහොමද වළක්වා ගන්නේ ඒ සඳහා ඔබත් එක්ක අරගලයක් කරන්න එ අරගලය මේ කරන්නේ එ නිසා දැන් අපිට සිද්ද වෙන්නේ දැන් අපේ වියදම් කළමණාකරණය කරන්න ඔබ දන්නවා වාහන ටික දුවන්න ඕනා ලක්ෂ 16ක් 17ක් අපිට ඕනැ අපි ටයර් ටියුබ් වගේම වාහන හදන්න ඕනැ. ඔබ දන්නවා ලක්ෂ 33 ක් ජූලි මාසයේ ගෙවනවා වාහන හදලා රේපයාර් කරන්න. මේ වාහන එකතැන තියන්න බැහැ එවා අපේ අත්‍යාවශ්‍ය වියදම් හැබැයි මේකේ තියෙනවා සමහර වැසිකිලි හදන්න තියෙනවා. ගරු නගරාධිපතිතුමණි, මෙන්න මේ තත්වය සංවාදයකට ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රිවරු මේක ගැනත් සංවාදයක් කරන්න සාකච්ජා කරන්න අරගල කරන්න වියදම් කරන ආකාරය මොන විධියටද කරන්නේ කියලා තමුන්නාන්සේලා දන්නේ නෑ දැන් මේ ආදායම් වියදම් හී ණයහිමියන්ට දෙනවා ලක්ෂ 91 ජූලි මාසේ අපි වෙනම යන්න ඔනා මේවා මොනවාටද මොනවාටද ගෙවන්නේ කියලා බලන්න වැඩ සටහන් කියලා දානවා ලක්ෂ 253 ක් මිලියන 25 ක් ඔබේ වියදම් කළමණාකරනය පිළිබද අපේ විරෝධය පලකරනවා එවගේම ගරු නගරාධිපතිතුමණි ඊයේ පෙරේදා එ කියන්නේ අපිට මුදල් උත්පාදන කමිටුවක් තියෙනවා ඒ කමිටුවේ කාර්යභාරය තමයි ආදායම් හොයාගන්න තියෙන තැන් පිළිබදව ඉතා හොඳින්

සමීක්ෂණයක් කරලා අපේ දේපල හා අපිට තියෙන බලය පාවිච්චිකරලා එවා කරන එක හැබැයි එක පාරට ඊයේ මම යනකොට මොරටුව දින පොලේ මුතා කරන්න රු 20 ක් ඉල්ලනවා මම දන්නෑ කව්ද එහෙම තින්දුවක් ගත්තේ? කොහෙන්ද ඒ තින්දුව ගත්තේ කවුරු හරි මේ සභාවේ සාකච්ජා නොකොට ඔවුන් එක්ක සාකච්ජා නොකොට දැන්මා මිනිහෙක්ව කඩපිය බිල්, දැන් ගෙදර මිනිහා කඩේ ඉන්න මිනිහා වගේ තමයි 8 වෙනකන් ඉන්නවා, 9 වෙනකන් ඉන්නවා. දියවැඩියාකාරයෙක් හිටියොත් දවසට හත් අට වතාවක් මුතා කරනවා ගෙවන්න වෙනවා විස්සෙ එවා හත අටක් එහෙද නැත්නම් ඔහුට අල්ලගෙන යන්න වෙනවා වැසිකිලියට නොගිහිල්ලා එලියට ඒ නිසා මේ තීන්දු අතිශය දුර්වලයි මේ තින්දුව සති දෙක තුනක් දුවන්න බෑ වැඩපිළිවෙලක් හදන්න දිනපොලේ අයට කියන්න ඔබේ සෞඛ්‍ය වෙනුවෙන් ඔබට මේච්චර වියදමක් දරලා හදලා දිපු වැසිකිලිය පවත්වා ගැනිම ඔබේ වගකිම සේවකයාට උදව් කරන්න දාන ලයිට් එක ගලවනවානම් ඔබ වගකියන්න ඕන දිනපොලේ අය පරිපාලකයෝ ඉන්නවා මුරකරුවෙක් ඉන්නවා දැන් දැන් ඔය මුරකරුවා ගෙනල්ලා පෙන්නන්න මම දෛනිකව ඔය දිනපොලට යනවා ඔය දිනපොලේ ඒ වෘත්තියේ යෙදි සිටින ඕන වෙලෙන්දෙක් ගෙනල්ලා අහන්න ඔවුන් මුරකාරයාව අඳුරනවාද කියලා මම අදවත් දන්නෑ මේ ලේඛනයක් ගත්තාම දැක්කා දිනපොලට මුරකාරයෙක් දාලා කියලා.

නගරාධිපතිතුමණි, මේවා නිවැරදි කරන්න ඒ විතරද නෙමෙයි ඔය මධ්‍යම වෙලදපොල පිළිබඳව ගන්න තීන්දු සමහර තින්දුගැන නැවත සැලකිලිමත්වෙන්න කොමසාරිස්තුමා අපේ කඩවලින් බදු දිපු කඩවලින් අති විශාල ප්‍රමාණයක් එක එක්කෙනා අතුරු බදු අරගෙන ඉවරයි කඩ දිපු බහුතරයක් කඩගත්ත අය කරන්නේ නැහැ. ඒ නිසා දැන් අපි කැමතිවුනත් අකමැතිවුනත් තියෙන්නේ එහෙම තින්දුවක් ගන්නකොට එක වලංගු වෙනවා. අපේ හැම කඩයකටම දැන් අපි නැවත හැරෙන්න නොහැරෙන විධියේ තීන්දුවක් ගන්න වෙනවා මම දන්න අවුරුදු 40 ක් අපේ කඩයක් කරනවා කඩය ගත්ත කෙනාගේ මුණුබුරු මිණිබිරියෝ ඇවිල්ලා අර කඩය කරන මිනිහාගෙන් බද්ද අරගෙන යනවා කුලිය අරගෙන යනවා අපිට පොඩි ගානයි මං කියන්නේ ආසාධාරණයි හැබැයි යථාර්තය එයයි. අපි මුහුණ දිලා තියෙන්නේ තීන්දුවක් ගන්න කොට ඉතිහාසේ පිළිබඳව හොඳින් හොයලා බලලා ගැටෙන්නැතිවෙන්න ඒ තින්දු ගන්න ඒ නිසා ගරු නගරාධිපතිතුමණි දැනට අපි ආදායම ගැන වැඩි සැලකිල්ලක් දක්වමු. හැබැයි දැන් අරවැනි යොජනානම් අපිට එකග වෙන්න බැනේ වරිපණම් අපේ ජනයාට ලදුපත් සමහර වෙලාවට නැතිවෙන්න පුලුවන් අස්ථානගතවෙන්න පුලුවන් ඒ වුනාම එනවා නගර සභාවට තමන්ගේ වරිපණම් මාසවල හිගය පොඩ්ඩක් බලාගන්න ඒ එනකෙනාට අපි කියනවානම් ඔයා එක මාසේට රු20ක් ගෙවන්න අපිට කාලේ යනවා මම කියන්නේ මේක වාණිජ ආයතනයක් නෙමෙයි මේක සේවාවන් සපයන්න මහජනයාගේ මුදලින්ම නඩත්තුවෙන ආයතනයක්. ඒ ආයතනය අයකල යුතු මොකක්ද නොකලයුතු මොකක්ද කියලා තේරුම් ගන්න හැමොම එන්නේ නැහැ. මනුස්සයෙක් ඇවිල්ලා කියනවා මගේ ගෙවපු බිල් එක අස්ථානගතවුනා මට උදව් කරන්න එනිසා ඒ පැත්තෙන් හිතන්න එහෙම බැරිනම් ඔය තන්දුවේ ඉන්න අය කරන්න මං කියන්නේ මම ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි ඔබෙන් ඉල්ලන්නේ රු.20න් මොනවා කරන්නද?

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමා කියන කඩ එක එක්කකෙනාට අතුරුබදුදිම ගැන කථාකරනකොට ඔබතුමාලා අපිම කථාකරලා ඥාති සම්බන්ධයක් ඇත්නම් එක ලබාදෙමු එගොල්ලෝම

පවත්වාගෙන යමු කියලා අපි කථාකලා අපි ඔක්කොම එකඟතාවයකට ඇවිල්ලා කරා දැන් මේතෙන්ට සමහර අය මෙතෙන්ට එනකොට වාරිපනම් බිල ඔවුන් ඇත්තටම ගෙදර අමතක වෙලා මෙතනට එන්නේ, මේතනට ඇවිල්ලා අපි නැවත බිලක් අරන්දිලා වරිපණම් කොලයක් අරන්දෙන කොට මේවා සල්ලි මේවා ඔබතුමාට නොතේරුනාට ඔය ඔක්කොම එන අය මෙතනට ඇවිල්ලා කියනවා මම බිල ගෙව්වා මම ඒක ගෙදර දාලා ආවා නෙමෙයි නැතිවුනා ගෙදර දාලා ඇවිල්ලා තියෙන්නේ ඇත්තටම නැතිවුනා කියලා අපි කොලයක් නිකන් දෙන්න ඕනැ. එතකොට මේය පාලනය කරන්න බැනේ. මේය අන්ඩු කොන්ට්‍රොල් වෙනවානේ ඊට පස්සේ එවිතරක් නෙමෙයි හැමතැනම ලංකාවේ ඕනම තැනකට සල්ලිවලට ලක්ෂ ගණන් කොටිගණන් දිලා ගත්ත අයත් එ තමන්ගේ වැසිකිලි කැසිකිලි පහසුකම්වලට යනකොට ගෙවන්න ඔන. එ ගෙන්වන්නේ නැති වුනාම කාලේ බොතල් හිරවුනාම කවුරුත් අදින්නැහැ. එහෙම අනාචාරයේ යන අයත් ඇවිල්ලා ඔතනට යන්නේ එක නිසා එක සම්පුර්ණයෙන්ම නතර කරන්න ඕනැ. අපි කාගේවත් කී මනි අරන් නැහැනේ, මේ වෙලෙන්දන්ගෙන් වෙලදාම කලොත් විතරයි රු.50 ක් ද 70 වක්ද ගන්නේ එනිසා මේවා ඔක්කොම දිලා මේ වකවානුකාලේ ඔබතුමත් කථා කරලා සියයට 50 අඩුකරනවා ඊට පස්සේ සියලුම වෙළද බදු අයින් කරනවා ඔක්කොම කරලා කරලා සභාව මේ ඔක්කොම නැති කරගෙන සභාව දුවන්නේ කොහොමද මේ ඔක්කොම කරලා සභාවක් දුවන්න බැ එනිසා ඔබතුමා කියන සාධනිය දෙවල් අපි හොදටම පිළිගන්නවා එවගේම මෙක සභාවක් ඔබතුමා එක පැත්තකින් කියනවා සෝපානය එපා කියලා අනෙක් පැත්තේන් කියනවා වැසිකිලියට 20 ගානේ ගන්නත් එපා කියලා කොහොමද මොකක්ද වෙන්නේ

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ ඩී නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම කියන හැම එකම ඔබ පිළිගන්නේ නැනේ? ඔබට සාධනියයි හැගෙන එක පිළිගන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එක හරි දැන් ඔබතුමා ගිය සභාවෙත් කිව්වානේ නිකන් කොළ දෙන්න මේක ටියුෂන් මාස්ටර් කෙනෙක්ගේ අත්පත්‍රිකාවක් දෙන එකක් නෙමෙයිනේ මේක මොකක්හරි පිළිවෙලක් තියෙන්න ඕනැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ ඩී නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම කියන මෙ තින්දුවට අපේ මතය ඔබ ඔබේ මතයේ ඉන්න එ පිළිබදව මොකද ඔබයි මායි හැම තිස්සේම එක මතයකට එනවානම් මම ඔබේ පක්ෂයේ වෙන්න එපැයි මම වෙන පක්ෂයක් නියොජනය කරන්නේ මට වෙන මතයක් තිබෙනවා

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ඔබතුමා මෙතන හිටියා නම් ඔබතුමාත් ඕක තමයි කියන්නේ

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ ඩී නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මම උත්සාහ කරනවා පුලුවන් තැන්වලදී ඔබව එකග කරගන්න.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔව් එක හරි, මම එහෙම එකගවෙච්ච තැන් ඔන තරම් තියෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ ඩී නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මගේ තර්කය අස්සේ මම උත්සාහ කරන්නේ කොහොමද මරාගෙන හරි කමක් නැහැ මේ ආයතනයට යහපතක් වෙන පැත්තට වැඩ කරන්න.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, එ ඔබේ වගකිම, මේ මගේ වගකිම

2021.08.13 දින පැවති මුදල් කමිටු වාර්තාවේ අංක 20හි සදහන් කරදියාන කසල අංගනයට අපද්‍රව්‍ය බැහැරලීමට අදාල ගිවිසුම්ගත වීම සම්බන්ධව නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කර ඇති අංක MMC/COM/01-V1 2021.08.02 දිනැති වාර්තාව හා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් එවා ඇති ගිවිසුම සම්බන්ධව (ඇමුණුම 05) තවදුරටත් **සලකා බැලීම සදහා ආයතන හා නීතිය පිළිබඳ / ඉඩම් හා නගර සංවර්ධන පිළිබඳ / මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ / පරිසර, සෞඛ්‍ය සනීපාරක්ෂාව පිළිබඳ / ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ / කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ / ව්‍යාපෘති හා භෞතික සම්පත් කලමනාකරණය පිළිබඳ / ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ / මුදල් පිළිබඳ වූ විශේෂ ඒකාබද්ධ ස්ථාවර කමිටු රැස්වීමක් පැවැත්වීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**2021.08.13 දින පැවති මුදල් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ අංක 20ට අදාල ඉහත සදහන් සභා සම්මුතිය ඇතුළුව සියළුම කමිටු තීරණයන්ට පක්ෂව පහත නම් සදහන් නාගරික මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |

| | | | |
|---|---|---|---|
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |

**2021.08.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09,13,18,26,27 විරුද්ධවත් අනෙකුත් කමිටු තිරණයන්ට හා අංක 20 දරණ කරුණට අදාල සභා සම්මුතියට පක්ෂවත් පහත නම් සදහන් මහා නගර සභා නාගරික මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |

**2021.08.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09,13,18 විරුද්ධවත්,අංක 26,27 තීරණයන්ට නිහඬවත්, අනෙකුත් කමිටු තිරණයන්ට හා අංක 20ට අදාල ඉහත සදහන් සභා සම්මුතියට පක්ෂවත් පහත නම් සදහන් නාගරික මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

**2021.08.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03,04,05,06,09,18,19 යන තීරණයන්ට විරුද්ධවත්,අංක 13(01) තීරණයන්ට නිහඬවත්, අනෙකුත් කමිටු තිරණයන්ට හා අංක 20ට අදාල ඉහත සදහන් සභා සම්මුතියට පක්ෂවත් පහත නම් සදහන් නාගරික මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2021.08.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 20ට අදාල ඉහත සදහන් සහා සම්මුතිය ඇතුළුව සියළුම කමිටු තීරණයන් වැඩි ඡන්දයෙන් සහා සම්මත විය.**

**(මෙම අවස්ථාවේදී පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය) |

## 07. ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ වැඩ ප්‍රගති වාර්තාව

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී,2021.08.13 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 ජූලි මාසයට අදාල මූල්‍ය වාර්තාව ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇත.

## 08. පුද්ගලික ස්භාවයේ කරුණු

**මහ නගර සභා මන්ත්‍රී - යූ අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමා, මට කරුණක් තියෙනවා අපේ මොරටුවේ ප්‍රදේශය තුල ආදාහනාගාර 4 යි තියෙන්නේ. දැන් මේ ආදාහනාගාර 4න් කොවිඩ් වසංගතයත් එක්ක රෝගීන් වෙලා මියයන පිරිස් වැඩියි.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

අනේ වාසනාවන් කොවිඩ් මරණ නොවේවා. දැන් ගොඩක් අඩුයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, අඩුවෙලා තියෙන්නේ, නමුත් මම කියන්නේ අගුලාන ආදාහනාගාරය කල්දේමුල්ල ලක්ෂපතිය ආදාහනාගාර වල තත්ත්වය පිළිබඳවයි.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ආදාහනාගාරය හදලා ඉවරයි.

**09.** **<u>වෙනත් කරුණු</u>** - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2021.09.16 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.